ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

தி அசோஸியேட்டட் நியூஸ் பேப்பர்ஸ் ஒப் சிலோன் லிமிட்டட்

**The Associated Newspapers of Ceylon Limited**

වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

# Annual Report 2013

# පටුන


| | |
|---|---|
| දැක්ම, මෙහෙවර හා වටිනාකම් | 1 |
| විශේෂිත මූල්‍ය දත්තයන් | 3 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 4 |
| ශ්‍රී ලංකා ආර්ථිකය කෙටියෙන් | 7 |
| මූල්‍ය සමාලෝචනය | 8 |
| අවදානම් කළමනාකරණය | 14 |
| ආයතනික පාලනය | 16 |
| අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව | 19 |
| මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම | 22 |
| විගණකාධිපතිතුමාගේ වාර්තාව | 23 |
| විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් සභාපතිතුමාගේ අදහස් දැක්වීම | 35 |
| විස්තරාත්මක ආදායම් ඇතුළත් ඒකාබද්ධ ප්‍රකාශය | 43 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශය | 44 |
| මුදල් ප්‍රවාහ ඇතුළත් ඒකාබද්ධ ප්‍රකාශය | 45 |
| හිමිකම් වෙනස්වීමේ ඒකාබද්ධ ප්‍රකාශය | 46 |
| ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට සටහන් | 47 |
| එකතුකළ වටිනාකම් ප්‍රකාශය | 61 |
| දස අවුරුදු සාරාංශය | 62 |
| කොටස් පිළිබඳ තොරතුරු | 63 |
| ආයතනික තොරතුරු | 64 |

# දැක්ම

අනෙකුත් මාධ්‍ය සේවා හැකියාවන් සමග ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මුද්‍රිත මාධ්‍ය ආයතනය ලෙස පැවැතීම.

# මෙහෙවර

ප්‍රධානතම පෙර ගමන්කරු බවට පත්වෙමින් රටේ විශ්වාසනීය හා උසස් තත්ත්වයේ මාධ්‍ය නිෂ්පාදන / සේවා සැපයීමේ ප්‍රමුඛයා ලෙස පිළිගැණෙන තත්ත්වයට අප පුරෝගාමී මුද්‍රිත මාධ්‍ය ආයතනය පරිවර්තනය වීම. මෙහෙයුම් විශිෂ්ටත්වය, නිෂ්පාදන අගයන් ඉහළ නැංවීම මගින් සහ පෘථුල ප්‍රවෘත්ති එක්රැස් කිරීම කාර්යක්ෂමව භාවිතා කරමින් හා අති නවීන තාක්ෂණය හා බැඳි යටිතල පහසුකම් වර්ධනය කිරීම මගින් අපි මෙම ඉලක්කය සපුරා ගන්නෙමු. අපගේ සෑම ක්‍රියාවකදීම ජාතික වැදගත්කම ප්‍රමුඛ කොට තබා ගනිමින් පැහැදිලිව නිර්ණය කළ උපාය මාර්ග අප වෙළඳපොළ නායකත්වය උසස් කර ලීමටත්, ලාභදායිත්වය හා වර්ධනය, තිරසාරව පවත්වා ගැනීමටත් අපි නිබඳවම කටයුතු කරන්නෙමු.

# වටිනාකම්

- **සංස්කෘතිය** : නව සොයා ගැනීම් කෙරෙහි යොමු වෙමින්, සහයෝගයෙන් හා කාර්යක්ෂමව ගනුදෙනුකරුවන් පෙරමුණ තබා ක්‍රියා කරමින් අපි සාර්ථක වන්නෙමු.
- **ව්‍යාපාර** : විවිධාංගීකරණය වූ මාධ්‍ය හා වෙළඳපල පිළිබඳ මීළඟ පරම්පරාව අපි සංවර්ධනය කරන්නෙමු.
- **ලේඛන කලාව** : විශ්වාසනීය හා උසස් තත්ත්වයේ දේශීය වශයෙන් නැඹුරු වූ මාධ්‍ය ආවරණයක් සලසන්නෙමු
- **සේවා** : ගනුදෙනුකරුවන්ට අවශ්‍ය කුමක්ද, කුමන වේලාවටද, කුමන ස්ථානයේද, හා අවශ්‍ය කෙසේද යන්න පිළිබඳ තීරණය කිරීමට නිදහස අපි ඔවුනට ලබා දෙන්නෙමු.
- **තත්ත්වය** : මෙහෙයුම් කාර්යක්‍ෂමතාවයන් තිරසාරව පවත්වා ගැනීමටත්, වැඩිදියුණු කිරීමටත්, අප ක්‍රියාකාරකම් සෑම අංශයකම වඩාත් හොඳින් ක්‍රියාවට නැංවීමට අපි ඉමහත් පරිශ්‍රමයක් දරන්නෙමු.
- **දර්ශනය** : අප සෑම ක්‍රියාවකදීම ජාතික වැදගත්කම ප්‍රමුඛ ස්ථානයේ ලා සලකමු.
- **කණ්ඩායම** : විවිධාංගීකරණය අගයන අතර, ඉහළ කාර්ය සාධනය අගය කරන්නෙමු.

# විශේෂිත වූ මූල්‍ය දත්තයන්

| | | 2013 | 2012 | වෙනස | වෙනස % |
|---|---|---|---|---|---|
| **ඉපයුම් විශේෂිත හා අනුපාත ලෙස** | | | | | |
| පිරිවැටුම | රු. ' 000 | **3,592,966** | 3,699,667 | (106,701) | (2.9) |
| බදු පෙර ලාභය හා වෙළඳ වට්නාකම ගැළපීම | රු. ' 000 | **73,074** | 57,429 | 15,645 | 27.2 |
| බදු පසු ලාභය | රු.' 000 | **58,945** | (8,280) | 67,225 | 811.9 |
| සේවකයෙක් සඳහා පිරිවැටුම | රු. ' 000 | **1,887** | 1,918 | (31) | (1.6) |
| සේවකයෙක් සඳහා බදු පෙර ලාභය සහ සාධාරණ අගය ගැළපීම | රු. ' 000 | **38** | 30 | 8 | 26.7 |
| ජාතික ආර්ථිකයට දායකත්වය | රු.' 000 | **595** | 577 | (18) | (3.1) |
| කෙටිකාලීන ආයෝජන වලින් ලද ආදායම | රු. ' 000 | **14,460** | 14,946 | (486) | (3.3) |
| මූල්‍ය පිරිවැය | රු.' 000 | **138,537** | 142,044 | (3,507) | (2.5) |
| කොටසක ඉපයීම | රු. | **17** | (2) | 19 | 950.0 |
| පිරිවැටුම මත බදු ගෙවීමට පෙර ලාභය හා සාධාරණ අගය ගැළපීම | % | **2.0** | 1.5 | 0.5 | 33.3 |
| යෙදූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ | % | **15.4** | (2.6) | 18.0 | 692.3 |

**ශේෂ පත්‍රයට අදළ විශේෂිතවූ හා අනුපාත (ශේෂ පත්‍ර දිනට)**

| | | | | | |
|---|---|---|---|---|---|
| මුළු වත්කම් | රු. ' 000 | **2,038,612** | 2,022,647 | 15,965 | 0.8 |
| දේපළ පිරියත හා උපකරණ | රු. ' 000 | **326,537** | 372,570 | (46,033) | (12.4) |
| දිගුකාලීන මූල්‍ය වත්කම් | රු.' 000 | **135,362** | 137,397 | (2,035) | (1.5) |
| කොටස් හිමියන්ගේ අරමුදල් | රු. ' 000 | **381,742** | 322,797 | 58,945 | 18.3 |
| නිකුත්කළ කොටස් ප්‍රමාණය | '000 | **3,484** | 3,484 | - | - |
| කොටසක ශුද්ධ වත්කම | රු. | **110** | 93 | 17 | 18.3 |
| ජංගම අනුපාතය | කාලය | **1.6** | 1.4 | 0.2 | 14.3 |
| ක්ෂණික අනුපාතය | කාලය | **1.1** | 1.0 | 0.1 | 10.0 |

# සභාපතිතුමාගේ සමාලෝචනය

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2013 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමාගමේ වාර්ෂික වාර්තාව, විගණනය කළ ගිණුම් හා අප ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනයක්ද සමග අපගේ කොටස් කරුවන් වෙත මහත් සතුටින් ඉදිරිපත් කරමි.

## ආර්ථික ක්‍රියාකාරිත්වය

අඛණ්ඩව පස්වන වසරටත් තනි අංකයක නතරව තිබූ උද්ධමනය වසර අවසානය වන විට ක්‍රම ක්‍රමයෙන් මැද තනි අංකයක් කරා ළඟාවීමට තවදුරටත් පහත වැටෙද්දී ශ්‍රී ලංකා ආර්ථිකය 7.3% ක වාර්ෂික සැබෑ දළ දේශීය නිෂ්පාදනය වර්ධනය සමග ශක්තිමත් ලෙස පරාවර්තනය විය. ආර්ථිකයේ සියළුම ක්ෂේත්‍රයන්හි වර්ධනයෙහි ලා ධනාත්මකව දායක වූ අතර වාසිදායක දේශගුණික තත්ත්වයන් සහ බාහිර ඉල්ලුම ක්‍රමයෙන් ප්‍රකෘති ස්වභාවයට පැමිණීම වසරේ කාර්තු හතර පුරාම ආර්ථිකය නියත වර්ධනයේ ලා උපකාරී විය. නාමමාත්‍රික අනුපාතයන්ට අනුව ද.දේ.නි. 14.5% සිට ඇමෙරිකානු ඩොලර් බිලියන 67 දක්වා වර්ධනය වී 2013 දී ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනය ඇමරිකානු ඩොලර් 3,280 තෙක් ඉහළ නැංවිණි.

දේශීය බලශක්ති මිලගණන් සැළකිය යුතු ලෙස ඉහළ යාම හමුවේ වුවද, දූරදර්ශී මූල්‍ය කළමණාකරණය සහ වැඩිදියුණු කළ අභ්‍යන්තරික ආහාර සැපයුම් මධ්‍යයේ මතුපිට උද්ධමනය ක්‍රමික පසුබැසීමකට ලක්වූ අතර මූලික උද්ධමනය එහි පහළම මට්ටමට පාලනය විය. 2013 වසරේ දී මූල්‍ය ව්‍යාප්තිය අපේක්ෂිත ලෙස මන්දගාමී වූ අතර පෙර වසරේ දැඩි මූල්‍ය ප්‍රතිපත්තිවල ප්‍රමාද වූ බලපෑම සහ රන් අනුබලය ලැබූ අත්තිකාරම් හි සීඝ්‍ර පහත වැටීම නිසා හේතු කොටගෙන, වාණිජ බැංකු මගින් පෞද්ගලික අංශයට ණය මුදල් ගෙවීම පහත වැටිණි

අඛණ්ඩව පැවති අඩු උද්දමනය රජයට ආර්ථික ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැළසීමට වසර තුළදී මූල්‍ය ප්‍රතිපත්ති තවදුරටත් ලිහිල් කිරීමට අවස්ථාව සළසා දුනි. 2012 වසරේදී රජය මගින් ක්‍රියාවේ යෙදවූ ප්‍රතිපත්තීන්, ප්‍රධාන අපනයන වෙළඳ පළවල ඇතිවූ ක්‍රමානුකූල ප්‍රකෘති වීම හා සමග, ගෙවුම් ශේෂයෙහි සැළකිය යුතු වැඩිදියුණුවීමක් ඇති කිරීමටත්, එමගින් නිල රක්ෂිත ගොඩනගාගෙන විනිමය අනුපාතයන්හි ස්ථාවරත්වයට උපකාරී වීමටත් හේතු විය.

බදුවල ස්ථාවරත්වයට රජයේ අඛණ්ඩ කැපවීම 2013 වසරේ ද.දේ. නිෂ්පාදිතයට ඇති ණය අනුපාතය හා බදු හිඟය තවදුරටත් අඩු කිරීමට උපකාරී විය. පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායකයන් පුනරුත්ථාපනය කිරීම මගින් බදුවල තත්ත්වය තවදුරටත් වැඩිදියුණු විය හැකිය.

## සමාගමේ ක්‍රියාකාරිත්වය

මුද්‍රිත හා මාධ්‍ය කර්මාන්තයේ දැඩි තරගකාරිත්වයක් පැවතියද 2012 වසරේ රුපියල් මිලියන 57 ක් ඉදිරියේ 2013 වසරේදී බදු හා සාධාරණ මිල ගැලපීමට පෙර රු. මිලියන 73 ක ලාභයක් ලබා ගැනීමට අපට හැකිවිය.

පෙර වසර හා සැසඳීමේදී සමාගම, දළ ලාභ අනුපාතය 2% ක වර්ධනයක්ද, මෙහෙයුම් ලාභයේ 6% ක වර්ධනයක්ද පෙන්නුම් කළේය. නමුත්, පෙර වසර හා සැසඳීමේදී මූල්‍ය වැය 2% පහත වැටීමක් පෙන්නුම් කළේය. මූල්‍ය වියදම අවම කිරීමට ක්‍රියාකාරී ප්‍රාග්ධනය කළමනාකරණය කිරීම සඳහා දැනටමත් සමහර පියවර ගෙන ඇති අතර ලබන වසර තුළ තවදුරටත් පියවර ගැනීමට බලාපොරොත්තු වේ.

නුදුරු අනාගතයේදී ප්‍රධාන භූමිකාවක නිරත වනු ඇතැයි බලාපොරොත්තු වන වාණිජ මුද්‍රණ අංශය ශක්තිමත් කිරීම සඳහා වසර තුල අංගසම්පූර්ණ Perfect Binder යන්ත්‍රයක් සහ Osaka Saddle Stitching යන්ත්‍රයට Feeder 2 ක් මිලට ගැනීම සඳහා රු මිලියන 21 ක මුදලක් ආයෝජනය කරන ලදී

දැඩි තරගකාරිත්වයක් තිබුණද, එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම මෙරට පුරෝගාමී ප්‍රකාශකයින් වශයෙන්, දැන්වීම් හා බෙදාහැරීම සඳහා වෙළඳපළෙහි සිය අංශය වැඩිදියුණු කර ගැනීමට සමත් විය. සමාගමේ ගනුදෙනුකරුවන්ගේ සිත් තුළ සන්නාම ප්‍රතිරූපය පිහිටුවීම ප්‍රවර්ධනය කරලීම පිණිස ක්‍රියාත්මක කරන ලද ක්‍රමෝත්පාදක එක්සත් උපාය මාර්ගයන් නිසාම එසේ කළ හැකි විය.

## දැන්වීම්

නිරීක්ෂණයට ලක්කෙරෙන වර්ෂය තුළ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමට විද්යුත් හා මුද්‍රණ මාධ්‍ය වල දැඩි තරගකාරීත්වයකට මුහුණ දීමට සිදුවිය. 2012 වසරට වඩා ආන්තික පසුබැස්මක් වාර්තා කරමින් 2013 වසරේදී රු. මිලියන 2280 ක දැන්වීම් ආදායමක් සමාගම ලබාගනී අනෙක් සමාගම් වල ක්‍රියාකාරී තරග මධ්‍යයේ වුවද මුද්‍රිත මාධ්‍ය දැන්වීම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා ලෙස අපගේ ස්ථානය රඳවා ගැනීමට හැකි වී ඇත.

මෙම වසර තුළ, ජංගම දුරකතන සේවා සපයන ප්‍රධාන පෙළේ සැපයුම් කරුවන් හා එක්ව ඔවුන්ගේ දායක භවතුන්ට ජංගම දුරකථන මගින් "සිළුමිණ" හා "ඉරිදා ඔබ්සර්වර්" පත්‍ර වලට ලුහුඬු දැන්වීම් එවීමට පහසුකම් සලසා දෙනු ලැබිණ.

2013 වසරේදී, දැන්වීම්කාර ගනුදෙනුකරුවන්ට වඩාත් කාර්යක්ෂම හා ඵලදායී ආකාරයෙන් සේවා සැපයීම

## සභාපතිතුමාගේ සමාලෝචනය

පිණිස පරිශීලනයට පහසු හා විශේෂිත වූ ආධාරක දුරකතන අංකයක් වෙන් කෙරිණි.

### බෙදාහැරීම

අපි, ප්‍රධාන දිනපතා පුවත්පත් 3 ක්ද, ප්‍රධාන සතිපතා පුවත්පත් 3 ක්ද, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් ප්‍රකාශයට පත් කරමු. නිෂ්පාදන බෑගයට විවිධ පාඨක කණ්ඩායම් ඉලක්කකරගත් වාර ප්‍රකාශන 17 ක් හා සඟරා 5 ක් ද, ඇතුළත්ව 2013 දෙසැම්බර් 31 වන දා වන විට සම්පූර්ණ ප්‍රකාශන සංඛ්‍යාව 28 ක් බවට පත්විය. 2013 වසරේදී සමාගම "අලෝකෝ උදපාදී" මුතු අහුර -1, මුතු අහුර -2, මුතු අහුර - 3, මුතු අහුර 4 සහ "බුදු සුවඳ" නමින් නව වාර ප්‍රකාශන 6 ක් හඳුන්වා දුන් අතර ඒවා දැනට සතුටුදායක ලෙස ක්‍රියාත්මක වේ මෙම සියළුම ප්‍රකාශන පෙර වසරේ රුපියල් මිලියන 674 හා සසඳන කල්හි 2013 වසරේදී අලෙවි ආදායම රු මිලියන 691 විය.

මෙම සියළුම ප්‍රකාශන බොහෝදුරට අපගේම වාහන, උප කොන්ත්‍රාත් වාහන සහ ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස් රථ යොදාගෙන දිවයින පුරා බෙදා හරිනු ලැබේ.

වෙළඳ පළෙහි අප රැඳී සිටීම වැඩි දියුණු කිරීම පිණිස අප විසින් 5 ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ, අ. පො. ස. සා/පෙ සම්මන්ත්‍රණ, සෞඛ්‍ය කඳවුරු, සංගීත සංදර්ශන ගණනාවක් දිවයින පුරා පැවැත්වූ අතර ඒ සියල්ල පාසල් සිසුන් හා පොදු මහජනතාව අතර බෙහෙවින් ජනප්‍රිය විය.

පුළුල් පාඨක පිරිසක් හා ප්‍රවෘත්ති වල ඵලදායිතාව ස්ථාපනය කිරීමේ අපගේ ඉලක්කය හා අනුව යමින් පුළුල් ආවරණයක් සහ බෙදාහැරීම සහතික කරලීමට අපගේ වාර්තාකරණ සහ නියෝජිත ජාලය නිතිපතාම යාවත්කාලීන කොට ඇත.

### වාණිජ මුද්‍රණ

සමාගමේ වාණිජ මුද්‍රණ දෙපාර්තමේන්තුව මෑත වසරවලදී නවීන යන්ත්‍ර සමග ඔවුන්ගේ තාක්ෂණික ධාරිතාව ව්‍යාප්ත කර ඇත. අංගසම්පූර්ණ Perfect Binder හා Saddle Stitching යන්ත්‍රය සඳහා Feeder ඒකක 2 ක් හඳුන්වා දීමත් සමග ඵලදායිත්වය තිවුරකර ප්‍රමාද වලින් තොරව වේලාවට භාණ්ඩ භාර දීම සහතික කර ඇත. වාණිජ මුද්‍රණ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා ටෙලිකොම් ජාතික දුරකථන නාමාවලිය මුද්‍රණය, ශ්‍රී ලංකා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ රජයේ පාසල් පෙළ පොත් මුද්‍රණය වැනි විශාල වාණිජ ඇනැවුම් භාර ගෙන ඇත.

2013 වසර තුළ රු. මිලියන 598 ක පිරිවැටුමක් වාර්තා කරමින් මැනැවින් ක්‍රියාත්මක වී ඇත.

### නිෂ්පාදන

ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට ප්‍රමුඛ පෙළේ ජංගම සේවා සැපයුම් කරුවන් වන ඩයලොග්, මොබිටෙල්, එටිසෙලාට් සහ එයාර්ටෙල් සමග ඔවුන්ගේ සේවාදායකයින්ට සිය ජංගම දුරකථන මගින් "සිළුමිණ" හා සන්ඩේ ඔබ්සර්වර්" පුවත්පත් වලට ලුහුඬු දැන්වීම් එවීම සඳහා එකඟතාවයන්ට එළැඹිණි. #429# අංක කරකැවීමෙන් තිරයේ දිස්වෙන උපදෙස් පිළිපදිමින් ජංගම ග්‍රාහකයින්ට එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම හා සම්බන්ධ වී තම දැන්වීම් රටේ ඕනෑම ස්ථානයක සිට දවසේ ඕනෑම වේලාවක භාර දිය හැකිය.

විශාල ප්‍රමාණයේ දැන්වීම් පිළිබඳ විමසීම් වලට වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස සේවා සැපයීම පිණිස, ඒ සඳහාම කැපවූ ගනුදෙනුකරුවන් සුරැකුම් විධායකයින් ගෙන් සමන්විත ව්‍යාපාරික හා විශේෂිත දුරකථන මාර්ගයක් (1949) 2013 ජූලි මාසයේදී දියත් කරන ලදි. ශ්‍රී ලංකාවේ ඕනෑම දුරකථන ජාලයකින් 1949 අංකය ඇමතීමෙන් එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ දැන්වීම් වලට අදාළව, මිල ගණන් වල සිට ප්‍රතිපත්තීන් හා දියුණු කිරීම් දක්වා ඕනෑම කාරණයක් පැහැදිලි කර ගැනීමේ අයිතිය ගනුදෙනුකරුවන් සතුවේ. ආසන්න වශයෙන් දිනකට ඇමතුම් 40 ක් - 50 ක් පමණ "1949" අංකයට ලැබේ. මේවා බොහෝ දුරට දැන්වීම් වලට අදාළ වන අතර සමහරක් කර්තෘ මණ්ඩලය සඳහාද වේ.

ඩේලිනිවුස් වෙබ් ජාලය සමහර අලුත්ම නිර්මාණ රටාවන් හා ආධාරක විචිත්‍රාංග සැළකිල්ලට ගනිමින් භාවිත කරන්නන්ට වැඩි පහසුව හා බැඳීම් ඇති කිරීමට ප්‍රති නිර්මාණය කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස www.dailynews.lk වෙත ප්‍රබල විශ්ව නියෝජනය තහවුරු කරමින් පිටු සඳහා යොමුවීම් වර්ධනය වී ඇත.

සමාගමේ ප්‍රවෘත්ති නියෝජිත ජාලය සහ ශාඛා සේවාවන් වඩාත් බලසම්පන්න කිරීමේ ප්‍රයත්නයක් වශයෙන් Ad-Pro හා සම්බන්ධවූ E-booking මොඩියුලයක් 2013 දී තවත් ස්ථාන 16 කට හඳුන්වා දෙන ලදි. මෙමගින් දැන්වීම් කරුවන්ට සමාගමේ දැන්වීම් පද්ධතිය හා විනාඩි කීපයක් ඇතුළත සම්බන්ධ වී තම දැන්වීම් සෘජුව වෙන් කර ගැනීමේ අවස්ථාව ලබාදෙයි.

දැන්වීම්කරුවන්ට අතිරේක ආවරණයක් ලබාදීම සඳහා ඔබ්සර්වර් ADZ ඔන්ලයින් පිටපත දියත් කෙරිණි. සන්ඩේ ඔබ්සර්වර් ADZ සඟරාවේ පළවන දැන්වීම්, රථවාහන, නිවාස හා දේපළ, පරිගණක, දුරකතන, සෞඛ්‍යය යනාදී ප්‍රධාන වර්ගයන් යටතේ සතිපතා adz.lk හි ලැයිස්තු ගත කෙරේ. www.adz.lk

# සභාපතිතුමාගේ සමාලෝචනය

ඩේලිනිව්ස් දිනමිණ සහ සන්ඩේ ඔබ්සර්වර් පත්‍රවල නිරීක්ෂණය කළ සාර්ථකත්වයන්ට පසුව ස්වාධීන විසඳුම් 2013 අප්‍රේල් මස සිළුමිණ කර්තෘ මණ්ඩලයටද ව්‍යාප්ත කරන ලදි භාවිත කරන්නන්ට පුහුණු සැසිවාර පැවැත්වීමෙන් පසු ක්‍රියාත්මක කිරීම සිදුවූ අතර සම්පූර්ණ සිළුමිණ ස්වාධීන විසඳුම් ක්‍රියාදාමය පිටුවල අංක දැමීම සමග 2013 ජුලි මස වන විට සම්පූර්ණ කරන ලදි. ස්වාධීන මෘදුකාංගය සඳහා බලපත්‍ර ලබාගැනීමට රු. මිලියන 3.7 ක් ආයෝජනය කරන ලදී.

## ආයතනික සමාජීය වගකීම / ආයතනික පාලනය

මෙරට වඩාත්ම ඉදිරියෙන් සිටින ජාතික මුද්‍රිත මාධ්‍යය වශයෙන් අපි අපගේ කොටස් කරුවන් වන සාමාජය කෙරෙහි අපගේ වගකීම මුදාහැරීමට කැපවී සිටිමු. වසර තුළ දැයට කිරුළ ප්‍රදර්ශනය, මිහින්තලා අලෝක පූජාව, වෙසක් අමාදහර, වසරේ පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා, වඩාත් ජනප්‍රිය රගර් ක්‍රීඩකයා වැනි තරග ආදියට සහභාත්වය ලබාදී කටයුතු කරගෙන ගියෙමු.

සාමාජික පාලනයට ප්‍රමුඛත්වය ලබා දෙන අපි, කොළඹ කොටස් හුවමාරුව සහ සුරැකුම් හා විනිමය කොමිෂන් සභාව යන ආයතනයන්හි ලැයිස්තුගත නීති රීති මගින් බැඳී අති ලැයිස්තු ගත සමාගම් වලට වඩාත් වැඩි වෙනසක් නැතිව සමාගම කළමනාකරණය කිරීමට පරිශ්‍රම දරන්නෙමු.

## කාර්ය මණ්ඩල සුභසාධනය

තෘප්තිමත් හා සෑහීමට පත් කාර්ය මණ්ඩලයකින් ඵලදායී සේවයක් ලබා ගත හැකි බව සමාගම පැහැදිලිව තේරුම් ගෙන තිබේ. මෙම අභිලාෂය වඩාත් ශක්තිමත් කිරීමේ අදහසින් මෙම වසරේද සමාගම සිය සුපුරුදු සුභසාධන වැඩසටහන කාර්ය මණ්ඩලයට ලබා දී ඇත. මෙම ක්‍රියාදාමය තුළ වාර්ෂික ප්‍රසාද දීමනා, බාහිර වෛද්‍ය සේවා, වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, ණය පහසුකම්, සේවකයින්ගේ දරුවන්ට සිංහල අලුත් අවුරුද්ද සඳහා තෑගි වවුචර් ලබාදීම, සේවකයින්ගේ පාසල් යන දූ දරුවන් වෙනුවෙන් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා උපකාරි වීමට, අභ්‍යාස පොත්, පාසල් නිළ ඇඳුම්, පාවහන් සහ පාසල් පොත් ලබාදීම, මගින් සේවකයින්ට වරප්‍රසාද භුක්ති විඳීමට සළස්වන ලදි මාධ්‍යවේදීන්ට හා වෙනත් සේවක මණ්ඩල සාමාජිකයින්ට අළුත්ම පොත් පත් ප්‍රකාශන කියැවීමට ඇති අවශ්‍යතාවය හඳුනාගෙන සැප්තැම්බර් සාහිත්‍ය මාසය තුළ එක් මාධ්‍ය වේදියෙකුට රු. 5000/- දක්වාද අනෙකුත් එක් සේවකයකුට රු 1500/- දක්වාද වැය කරන මුදල් ආපසු ලබා දෙන ලදී.

## අනාගතය

අප විසින් කරන ලද ආයෝජනයන් හා ලැබූ පළපුරුද්ද සළකා බැලීමේ දී අනාගතය පිළිබඳව අපි සර්වශුභවාදී වෙමු. පුවත් මුද්‍රණ කර්මාන්තයේදී මුහුණ දීමට ඇති දැඩි තරඟ කාරිත්වය හමුවේ උසස් තත්ත්වයේ පුවත්පත් මුද්‍රණ සඳහා උසස් තත්ත්වයේ මුද්‍රණ යන්ත්‍රයක අවශ්‍යතාවය තදින් දැනේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ මාගේ මිතුරන්ගේ සහායෙන් සහ සේවකයින්ගේ සහයෝගයද සමග 2014 වසරේදී අපට එක්සත්ව නැගී සිටීමට හැකිවන බව මට විශ්වාසය.

## ඇගයීම

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්, 2013 වසර ලේක් හවුස් ආයතනයේ ඉතිහාසයේ තවත් විශිෂ්ඨ සංධිස්ථානයක් කිරීමේ ලා සියළුම කොටස් හිමිකරුවන් ලබාදුන් දායකත්වය අගය කරමි. අතිශයින්ම පක්ෂපාතී අධිෂ්ඨානශීලී හා ඵලදායී සේවක මණ්ඩලය සමග කාර්යක්ෂම කළමනාකාරිත්වය ලේක් හවුස් ආයතනය ප්‍රබෝධමත්ව මෙහෙයවනු ලබයි. සභාපති වශයෙන් සමාගම මෙහෙයවීමේදී අභියෝගාත්මක තත්ත්වයන් යටතේ සාර්ථක ක්‍රියාකාරීත්වයෙන් සපිරි තවත් වසරක් සනිටුහන් කිරීමට මගේ කණ්ඩායම කෙරෙහි තැබූ විශ්වාසය මත මගේ මිතුරන්ගෙන් මට සහාය සහ මඟ පෙන්වීම ලැබිණි.



**බන්දුල පද්මකුමාර**
**සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ**

# ශ්‍රී ලංකා ආර්ථිකය කෙටියෙන්

## ප්‍රධාන ආර්ථික දත්ත

| | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013(අ) |
|---|---|---|---|---|---|---|
| **ජන විකාශය** | | | | | | |
| වසර මැද ජනගහනය (පුද්ගලයින් '000) | 20,217 | 20,450 | 20,653 | 20,869 | 20,328 | 20,483 |
| ජනගහන වර්ධනය (%) | 1.1 | 1.1 | 1.0 | 1.0 | 0.9 | 0.8 |
| ශ්‍රම බලකාය (පුද්ගලයින් '000) | 8,082 | 8,074 | 8,108 | 8,565 | 8,454 | 8,802 |
| රැකියා වියුක්ති අනුපාතය (ශ්‍රම බලකාය %) | 5.4 | 5.8 | 4.9 | 4.2 | 4.0 | 4.4 |
| **නිපැයුම** | | | | | | |
| වෙළඳපොළ වටිනාකමට දළ දේශීය නිෂ්පාදන (රු. බිලියන) | 4,411 | 4,835 | 5,604 | 6,543 | 7,579 | 8,674 |
| වෙළඳපොළ වටිනාකමට ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනය (රු.) | 218,167 | 236,445 | 217,346 | 313,542 | 372,814 | 423,467 |
| **සත්‍ය නිපැයුම (වෙනස %)** | | | | | | |
| දළ දේශීය නිෂ්පාදනය | 6.0 | 3.5 | 8.0 | 8.2 | 6.3 | 7.3 |
| **වැටුප් සහ මිල ගණන් (වෙනස %)** | | | | | | |
| කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2002 = 100) - වාර්ෂික සාමාන්‍ය | 22.6 | 3.4 | 5.9 | - | - | 0 |
| නාමික වැටුප් අනුපාත දර්ශකය පඩිපාලක සභා සේවකයින් සඳහා | 25.6 | 4.9 | 32.0 | 4.6 | 22.2 | 5.7 |
| **විනිමය අනුපාතය** | | | | | | |
| වාර්ෂික සාමාන්‍ය රු./ඇමරිකන් ඩොලර් | 108.33 | 114.94 | 113.06 | 110.57 | 127.60 | 129.11 |
| වසර අවසානය රු./ඇමරිකන් ඩොලර් | 113.14 | 114.38 | 110.95 | 113.90 | 127.16 | 130.75 |
| **පොලී අනුපාතය (වර්ෂය අවසානයේ වාර්ෂික%)** | | | | | | |
| නැවත මිලදී ගැනීම් අනුපාතය (දිනකට) | 10.50 | 7.50 | 7.25 | 7.00 | 7.50 | 6.50 |
| අවලංගුකොට නැවත මිලදී ගැනීම් අනුපාතය | 12.00 | 9.75 | 9.00 | 8.50 | 9.50 | 8.50 |
| භාණ්ඩාගාර බිල්පත් අනුපාතය දින 91 | 17.33 | 7.73 | 7.24 | 8.68 | 10.00 | 7.54 |
| දින 364 | 19.12 | 9.33 | 7.55 | 9.31 | 11.69 | 8.29 |
| **තැන්පතු අනුපාතය** | | | | | | |
| වෙළඳ බැංකුවල බර තැබූ සාමාන්‍ය තැන්පතු අනුපාතය (AWDR) | 11.63 | 8.01 | 6.23 | 7.24 | 10.10 | 9.37 |
| වෙළඳ බැංකුවල මාස 12 ස්ථාවර තැන්පතු (උපරිම) | 20.25 | 22.00 | 17.00 | 11.00 | 17.00 | 16.00 |
| **ණය පොලී අනුපාතය** | | | | | | |
| වෙළඳ බැංකුවල බර තැබූ සාමාන්‍ය මූලික ණය පොලී අනුපාතය (AWPR) | 18.50 | 10.91 | 9.29 | 10.77 | 14.40 | 10.13 |
| **ප්‍රාග්ධන වෙළඳ පොළ** | | | | | | |
| සියලු කොටස් මිල දර්ශකය (1985 = 100) | 1,503.0 | 3,385.6 | 6,635.9 | 6,074.4 | 5,643.0 | 5,912.8 |
| මිලංක මිල දර්ශකය (1998 දෙසැ =1000) | 1,631.3 | 3,849.4 | 7,061.5 | 5,229.2 | 5,119.1 | 0 |
| එස්/පී එස් එල් 20 දර්ශකය | | | | | 3,085.3 | 3,263.9 |
| වෙළඳපොළ ප්‍රාග්ධනය (රු. බිලියන) | 488.8 | 1,092.1 | 2,210.5 | 2,213.9 | 2,167.6 | 2,459.9 |

(අ) තාවකාලික

# මූල්‍ය සමාලෝචනය

## 1) මෙහෙයුම් ප්‍රතිඵලය

2013 වර්ෂයේදී ආයතන සමූහය බදු ගෙවීමට පෙර හා සාධාරණ අගය ගැළපීමෙන් පසු රු. මිලියන 73.1 ආදායමක් වාර්තා කරණ ලදී. එය 2012 වර්ෂය හා සසඳන කළ රු. මිලියන 15.7 ක වර්ධනයකි. ආදායම රු. මිලියන 106.7 කින් පහල ගිය අතර ඊට වෙළඳ මුද්‍රණ අංශයට පාසැල් පෙළපොත් මුද්‍රණය නොලැබීම හේතුවිය. විකුණුම් පිරිවැය අඩුවීම වෙළඳ මුද්‍රණ අංශයේ ආදායම පහළ යාමට හේතුවිය. ඒ අතරතුර විවිධ විකුනුම්වල ඉහල යාම ආදායම් වල සැලකියයුතු වර්ධනයට ඉවහල්විය.

පසුගිය වර්ෂය හා සසදන කළ පරිපාලන වියදම් 2% කින් වැඩිවූ අතර බෙදාහැරීමේ වියදම් එකම මට්ටමක පැවතිනි. කෙසේනමුත් එය ආන්තික වන නමුදු අඩු මූල්‍ය වියදම් අනාගතය දෙසට ධනාත්මක නැඹුරුවක් දක්වයි.

**මෙහෙයුම් ප්‍රතිඵල සැසඳීම**

| අයිතමය | 2012 -රු. මිලියන | 2013 - රු. මිලියන | වෙනස % |
|---|---|---|---|
| ආදායම | 3,699.7 | 3593.0 | -3% |
| විකුණුම් පිරිවැය | (1,993.4 ) | (1,873.2 ) | -6% |
| දළ ලාභය | 1,706.3 | 1719.8 | 1% |
| වෙනත් ආදායම් | 105.7 | 137.7 | 30% |
| පරිපාලන වියදම් | (1,289.0 ) | (1,320.0 ) | 2% |
| බෙදාහැරීමේ වියදම් | (323.5 ) | (325.9 ) | 1% |
| මූල්‍ය වියදම් | (142.1 ) | (138.5 ) | -3% |
| බදු හා වෙළඳපොල අගය ගැළපීමට පෙර ලාභය | 57.4 | 73.1 | 27% |



## 2) ආදායම

### මුළු ආදායම

වර්ෂය තුළදී මුළු ආදායම රුපියල් මිලියන 106.7 කින් පහත වැටුණි. එය පහත සාරාංශගත සටහනට අනුව 2012 වර්ෂයට වඩා 3% පහළ වර්ධනයකි.

| අයිතම | 2012 -රු. මිලියන | 2013 -රු. මිලියන | වෙනස රු. මිලියන | වෙනස -% |
|---|---|---|---|---|
| වෙළඳ දැන්වීම් ආදායම | 2,296.1 | 2,280.4 | -15.7 | -1% |
| පුවත්පත් අලෙවි ආදායම | 674.4 | 690.8 | 16.4 | 2% |
| වෙළඳ මුද්‍රණ ආදායම | 721.9 | 597.6 | -124.3 | -17% |
| වාර්ෂික ප්‍රකාශන ආදායම | 6.7 | 3.9 | -2.8 | -42% |
| ඩිජිටල් ප්‍රින්ටින් | 0 | 3.8 | 3.8 | 0% |
| ඉන්ෆෝ මීඩියා (පුද්ගලික) සමාගම | 0.6 | 0 | -0.6 | -100% |
| බිස්නස් ලංකා ඒඑන් (පුද්ගලික) සමාගම | 0 | 16.5 | 16.5 | - |
| **මුළු ආදායම** | **3,699.7** | **3,593.0** | **-106.5** | **-3%** |



# මූල්‍ය සමාලෝචනය

**දැන්වීම් ආදායම**

දැන්වීම් ආදායම සමාගමේ ප්‍රධාන ආදායම් ප්‍රභවයයි. වර්ෂයෙන් වර්ෂයට ආදායම අඩු වී 2013 වර්ෂයේදී රු. මිලියන 15.7 විය. එය 1% ක පහළ වර්ධනයකි.




**බෙදාහැරීම් ආදායම**

අනාගත තාක්ෂණික සංවර්ධනය අභියෝගයක් වුවත්, 2013 වර්ෂයේදී පුවත්පත් අලෙවි ආදායම එකම මට්ටමක පවත්වා ගෙන යාමට හැකිවිය.



**වාණිජ මුද්‍රණ අංශයේ ආදායම**

පසුගිය වසර කීපය මුළුල්ලේම අප වෙළඳ මුද්‍රණ අංශයේ ධාරිතාව සහ ගුණාත්මක බව පුළුල් කර ඇත. එම නිසා රජයේ පාසැල් පෙළපොත් මුද්‍රණයේ ටෙන්ඩරයෙන් සහ ශ්‍රී ලංකා ටෙලිකොම් ජාතික දුරකථන නාමාවලියේ මුද්‍රණයෙන් සැලකිය යුතු තරම් ප්‍රමාණයක් ලබාගැනීමට හැකිවිය.

බාහිර වැඩවලට අමතරව, වෙළඳ මුද්‍රණ අංශය ආයතනයේ පුවත්පත් සඳහා වට්නාකම් එකතු කරන ලදී. ආදායමේ සම්ප්‍රයුක්ත පිරිවැටුම බෙදීයාම පහත පරිදිවේ.

| **අයිතම** | **2012 - රු. මිලියන** | **2013 - රු. මිලියන** | **වෙනස %** |
|---|---|---|---|
| බාහිර ආදායම | 448.8 | 294.5 | -34% |
| අභ්‍යන්තර ආදායම | 277.1 | 303.1 | 9% |
| **මුළු ආදායම** | **721.9** | **597.6** | **-17%** |



# මූල්‍ය සමාලෝචනය

## 3) විකුණුම් පිරිවැය

ආයතනයේ විකුණුම් පිරිවැය පහත පරිදි විග්‍රහ කළ හැක.

| ව්‍යාපාරයට අයත් කොටස් | 2012 - රු. මිලියන | 2013 - රු. මිලියන | වෙනස % |
|---|---|---|---|
| මුද්‍රණ කඩදාසි | 1,389.2 | 1,413.4 | 2% |
| වෙළඳ මුද්‍රණ | 593.8 | 447.8 | -25% |
| වෙනත් | 10.4 | 12.0 | 15% |
| **එකතුව** | **1,993.4** | **1,873.2** | **-6%** |

ව්‍යාපාර කටයුතු පහල වැටීමේ ප්‍රතිඵලය හේතුවෙන් 2013 වර්ෂයේදී වෙළඳ මුද්‍රණ කටයුතු සඳහා විකුණුම් පිරිවැය රු. මිලියන 146 කින් හෙවත් 25% කින් පහළ වැටුණි.




**පුවත්පත් වල විකුණුම් පිරිවැයේ විශ්ලේෂණය පහත පරිදි වේ.**






## 4) වියදම්

පහත දැක්වෙන විශ්ලේෂණ සටහනට අනුව පසුගිය වර්ෂය හා සසඳන කළ මුළු වියදම රු. මිලියන 29.5 කින් වැඩි වී ඇත. එය 2% ක වර්ධනයකි.

| **අයිතම** | 2012 රු. මිලියන | 2013 රු. මිලියන | **වෙනස රු. මිලියන** | **වෙනස -%** |
|---|---|---|---|---|
| පරිපාලන වියදම් | 1,289.0 | 1,320.0 | 31.0 | 2% |
| බෙදාහැරීමේ වියදම් | 323.5 | 326.0 | 2.5 | 1% |
| මූල්‍ය වියදම් | 142.0 | 138.0 | -4.0 | -3% |
| **මුළු වියදම්** | **1,754.5** | **1,784.0** | **29.5** | **2%** |



# අවදානම් කළමනාකරණය

## දැන් අපගේ ව්‍යාපාර පෙරසැරියේ අවශ්‍ය කොටසක් වීම

අවදානම වෙළෙඳපොළ ආර්ථිකයක තරග කිරීමේදී ඇතිවන නොවැළැක්විය හැකි අංගයකි. ආයතනයේ පරමාර්ථ හා අරමුණු ළඟා කරගනිමින් අඛණ්ඩ වර්ධනයක් ලබාගැනීම සඳහා අවදානම් කළමනාකරණය ඉතා වැදගත් සාධකයකි. ගන්නා වූ ක්‍රියාමාර්ගවල ඇගයීම පිණිස හා පරීක්ෂාව පිණිස මෙන්ම ආයෝජනය හා ක්‍රියාකාරකම් පිළිබඳව තීරණවලට ප්‍රතිඵල අන්තර්ගත කිරීමේදී සහ විවිධ වර්ගයේ අවදානම් - ඇගයීමට වගකිවයුතු සමාගමක් වශයෙන් අපට හැකි විය.

යෝග්‍ය කළමනාකරණ ප්‍රතිපත්තියේ පූර්ණ කොටසක් ලෙස අවදානම් කළමනාකරණය පත්වේ. ආරෝපණය කරන ලද මූල්‍ය හා වෙනත් පහසුකම් සමාන ලෙස වැදගත් කොට සලකයි.

සමාගමේ අවදානම් කළමනාකරණ පද්ධතිය තුළ හඳුනාගත් ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර පහත පරිදි වේ.

### (1) ණය අවදානම් කළමනාකරණය

සමාගමේ ණය ගැතියන් එකඟවූ කාලසීමාව තුළ ණය මුදල් නොපියවීම නිසා සිදුවන මූල්‍යමය අලාභය ණය අවදානම ලෙස හඳුන්වයි. වෙළඳ පොලේ සැලකිය යුතු ආර්ථික අවපාතයන්, සහ පොලී අනුපාතයන් ඉහල නැගීම යනාදී කරුණු ණය ආපසු අයකර ගැනීමේ කාර්ය ඵලය පහත හෙළීමට හේතු වේ.

මනා ඇගයීමකට ලක් කළ පසු පළපුරුදු සේවක මණ්ඩලයක් විසින් ණය අනුමත කිරීම් සිදුකරනු ලබයි. ණය අනුමත කිරීම සඳහා විවිධ තරාතිරමේ අධිකාරි බලයන් පවරා ඇත. අතිරේක ආරක්ෂණයක් ලෙස ගනුදෙනුකරුවන්ගෙන් ඇපකර හා තැන්පතු වැනි සුරැකුම් ලබා ගැනීමට කටයුතු කර ඇත. ණය දීමේ ක්‍රියා පද්ධතිය මනාව අනුගමනය කරන අතර අඩමාණ ණය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සිදු කර ඇත.

### (2) මෙහෙයුම් අවදානම් කළමනාකරණය

මෙහෙයුම් අවදානම් යනු මානව වැරදි, අයෝග්‍ය හෝ වැරදි අභ්‍යන්තර ක්‍රියාවලියන්, පද්ධති බිඳ වැටීම් සහ අභ්‍යන්තර පාලනයන් කඩකිරීම්, වංචා, නීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම හෝ සාධාරණ ලෙස දැකිය නොහැකි විපත් වැනි බාහිර සාධක හේතු කොටගෙන ඇතිවන අවදානම්ය.ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතියේ අත්‍යවශ්‍ය අංගයක් වන අභ්‍යන්තර විගණන අංශය විගණන කමිටුවට වාර්තා කරනු ලැබේ.

සමාගමේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව අභ්‍යන්තර පාලන පද්ධතිය අනුගමනය කෙරෙන බවටත් ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් පවතින බවටත් නිරතුරුව නිරීක්ෂණය කරනු ලබයි.

සමාගමේ ස්පෘශ්‍ය වත්කම් හඳුනාගත් අවදානම් සඳහා රක්ෂණය කර ඇත. සියලුම රක්ෂණ ඔප්පු වාර්ෂික ඇගයීමකට සහ විමර්ෂණයකට බඳුන් වෙයි.

### (3) නෛතික අවදානම් කළමනාකරණය

එහි සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී ආයතනය නෛතික ක්‍රියා මාර්ග සහ හිමිකම් පෑම සඳහා බඳුන්වේ. මෙම සියලුම කාර්යයන් අවදානමට හා අවිනිශ්චිතතාවයන්ට බඳුන් වන අතර ප්‍රතිඵලය කිසිම අවස්ථාවකදී නියත වශයෙන් කිව නොහැක. නීති අංශය අවදානම අවම කරගැනීම සඳහා සමාගමේ සියලුම ක්‍රියාමාර්ග හා සිදුවීම් නෛතික සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුකූලව සිදුවන බවට සහතික වෙයි.

### (4) මානව සම්පත් සම්බන්ධව අවදානම් කළමනාකරණය

ව්‍යාපාරය අඛණ්ඩව පවත්වාගෙන යාම පිණිස මානව ප්‍රාග්ධනය වර්ධනය කිරීම අත්‍යවශ්‍ය බව සමාගම සලකයි. සේවකයින් සුදුසු ලෙස දේශීය හා විදේශීය වශයෙන් සමාගමේ මිනිස් සම්පත් වර්ධන කාර්යයේදී පුහුණු කරනු ලැබේ.

## (5) සෞඛ්‍ය හා ආරක්ෂණ අවදනම් කළමනාකරණය

ව්‍යාපාරයේ අඛණ්ඩත්වයට හේතුවන මානව ප්‍රාග්ධනය අත්‍යවශ්‍ය බව සමාගම විශ්වාස කරන බැවින් වැඩකරන ස්ථානය තුළ සේවක සෞඛ්‍ය හා සුරක්ෂිතභාවය අවධානමට අදාළ ඒ ඒ ස්ථානයේ සේවය කරන පුහුණු වූ පිරිස් අනතුරු වීමට ඉඩකඩ ඇති යන්ත්‍රෝපකරණ පිළිබඳ සුරක්ෂිතභාවය පිළිබඳව පූර්ණ විධිවිධාන ගෙන ඇත.

## (6) තොරතුරු අවදනම් කළමනාකරණය

පරිගණක ක්‍රමයේ සහය ඇතිව සමාගමේ පාර්ශවකරුවන්ට අවශ්‍ය නිවැරදි හා අදාළ තොරතුරු දීමට සමාගමට හැකිවිය. කලින් කලට පද්ධතිය සමාලෝචනය කරන අතර මෘදුකාංග සපයන්නන් සමග නඩත්තු කිරීමේ ගිවිසුමක් ඇති කරගෙන ඇත.

# ආයතනික පාලනය

සමාගම් මෙහෙයවන සහ පාලනය කරන ක්‍රම පද්ධතිය ආයතනික පාලනය යනුවෙන් අදහස් කරයි. ආයතනය සෑම අවස්ථාවකදීම එහි ක්‍රියාකාරිත්වය ඉහළ සදාචාරාත්මක ප්‍රමිතියකින් සහ සියලු පාර්ශවයන්ගේ අභිවෘද්ධිය පිණිස පවත්වාගෙන යන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වෙයි. මේ සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය ප්‍රකාශයට පත් කරන ලද ප්‍රතිපත්ති සහ යෝග්‍ය පරිචයන් මග පෙන්වයි.

## අධ්‍යක්ෂ මණ්ඩලය

### සංයෝජනය

අධ්‍යක්ෂ මණ්ඩලය සභාපතිවරයෙකුගෙන් සහ විධායක අධ්‍යක්ෂවරු සතර දෙනෙකුගෙන් සමන්විතයි. මහා භාරකාර මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරු තිදෙනෙකු පත්කරනු ලබන අතර, කොටස් කරුවන් විසින් අධ්‍යක්ෂවරු දෙදෙනෙකු පත්කරනු ලබයි. සභාපතිතුමා අධ්‍යක්ෂක මණ්ඩලය පවත්වාගෙන යාමේ වගකීම දරන්නා ලෙස නිසි පාලනයක් පවත්වාගෙන යන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය සඵලදායී ලෙස ඉටුකිරීමට අවශ්‍ය පහසුකම් සපයයි.

## පවත්වනු ලැබූ ස්ථිර රැස්වීම් හා සහභාගි වීම්

අධ්‍යක්ෂ මණ්ඩලය සාමාන්‍යයෙන් දෙසතියකට වරක් රැස්වන අතර අවශ්‍ය අවස්ථාවලදී විශේෂ රැස්වීම් පවත්වනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය පුළුල් පරාසයක විහිදුන කුසලතාවලින් සහ පළපුරුද්දකින් සමන්විත වන අතර ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡා වලදී ස්වාධීන මතයක් සහ සැලකිය යුතු දැනුමක් එක් කරනු ලැබේ. 2013 වර්ෂය තුළදී රැස්වීම් පැවැත්විය.

අධ්‍යක්ෂවරුන්ගේ සහභාගිත්වය පහත සඳහන් සටහනින් පෙන්නුම් කරයි.

| **අධ්‍යක්ෂකගේ නම** | **සහභාගි වූ රැස්වීම් සංඛ්‍යාව** |
|---|---|
| බන්දුල පද්මකුමාර මහතා | 18 |
| එදිරිසිංහ විතානගේ ප්‍රසාද් රසාංග හරිස්චන්ද්‍ර මහතා | 18 |
| උපුල් රංජන් සමරසිංහ දිසානායක මහතා | 18 |
| සීලරත්න සෙනරත් මහතා | 18 |

## රැස්වීම් කමිටු සහ එහි සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කරන ලද විගණන කමිටුව, ප්‍රාග්ධන වියදම්, ආනයනික සහ දේශීය මිලට ගැනීම් සඳහා වූ ප්‍රසම්පාදන කමිටු අධ්‍යක්ෂවරුන්ගේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගෙන් සමන්විතයි.

## මූල්‍ය වාර්තාකරණය සහ විනිවිදභාවය

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම, සංකල්ප සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය මගින් දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව පිළියෙල කර ඇත. මෙම වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිතුමා විසින් විගණනය කර ඇත.

## මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශයක් මෙම වාර්ෂික වාර්තාවේ 22 පිටුවේ සඳහන් වේ.

## ව්‍යවස්ථාපිත ගෙවීම් සමඟ අනුකූලතාවය

සියලුම හඳුනාගත් ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත පරිදි ගෙවා ඇති බවත් සේවකයන් වෙනුවෙන් ගෙවිය යුතු සියලුම දායක මුදල් ගෙවා හෝ ගිණුම්කරණ ප්‍රතිපාදන සිදුකර ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.

## අභ්‍යන්තර පාලනය

අභ්‍යන්තර පාලන ක්‍රම පද්ධතියක් සැලසුම් කරනුයේ නිසි කාර්ය හා බලතල විභජනය කිරීමෙන් හා අභ්‍යන්තර සහ බාහිර විගණන ක්‍රියාමාර්ග තුළින් මනා කාර්ය පටිපාටියක් මගින් වැරදි, මගහැරීම් වලින් සිදුවන අවදානම අවම කර ගැනීමට, ආයතනයේ වත්කම් ආරක්ෂා කර ගැනීමට සහ ගිණුම් පොත්පත් පවත්වාගෙන යාම සඳහාය.

ආයතනය තුළ ප්‍රමාණවත් සහ ඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක වන බවට සහතික කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමයි. සමාගමේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව එදිනෙදා සිදුවන මූල්‍යමය සහ මූල්‍යමය නොවන කටයුතු නිරන්තරයෙන් විමර්ශණය කරයි.

## කොටස් හිමියන් සමග සබැඳියාව

සමාගම උදෙසා කොටස් හිමියන්ගේ සැලකිය යුතු භූමිකාව අධ්‍යක්ෂ මණ්ඩලය නිරන්තරයෙන් හඳුනා ගෙන ඇත. සමාගම වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස් හිමියන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වයක් බලාපොරොත්තු වන අතර ඔවුනගේ යෝජනාද සාදරයෙන් පිළිගනියි.

## ආයතනික සමාජයීය වගකීම

සමාගම  සියලු ජාතීන් හා සමාජය උදෙසා එහි වගකීම මැනවින් අවබෝධකර ගෙන ඇත.

## සේවක කරුණු සහ අදහස් හුවමාරුව

සේවකයින්ට ඕනෑම මොහොතක ඔවුන්ගේ දුක්ගැනවිලි හා ප්‍රශ්න කළමනාකාරිත්වයට ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත. කළමනාකාරිත්වය ඔවුන්ට සවන්දී එම අවස්ථාවේදීම විසඳුම් සපයයි.

## පාරිසරික ආරක්ෂණය

පරිසර දූෂණයට බලපාන කිසිම කටයුත්තක් අප ආයතනය විසින් නොකරන අතර එවැනි දෙයක් සිදු නොවන ආකාරයේ උපරිම ක්‍රියාමාර්ග අනුගමනය කර ඇති බව දන්වන අතර සැමවිටම පරිසරය ආරක්ෂා කරන නීති පිළිපැදීමට බැඳී සිටී.

## අඛණ්ඩ පැවැත්ම

සාධාරණ ලෙස දැකිය හැකි කාලයක් පුරාවට මෙහෙයුම් කටයුතු කරගෙන යෑම සඳහා සමාගම සතුව ප්‍රමාණවත් සම්පත් පවතින බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්වේ. ඒ නිසා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සමාගම "අඛණ්ඩ පැවැත්ම" පදනම අනුගමනය කරයි.

## විගණන හා කළමනාකරණ කමිටු

විගණන හා කළමනාකරණ කමිටු රැස්වන්නේ ත්‍රෛයිමාසික පදනමෙනි. එම කමිටුව සෑදී තිබෙන්නේ පහත පරිදිය.

| | | |
|---|---|---|
| බන්දුල පද්මකුමාර මහතා | - | සභාපති හා කළමනාකරණ අධ්‍යක්ෂ (කමිටු සභාපති) |
| රසාංග හරිස්චන්ද්‍ර මහතා | - | නීති හා පරිපාලන අධ්‍යක්ෂ |
| අභය අමරදාස මහතා | - | සාමාන්‍යාධිකාරී |
| කුමුදු ගුණවර්ධන මහත්මිය | - | සමාගමේ ලේකම් |
| විරාජිත් බොයිෂ් | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) |
| සිසිර නාත් අධිකාරි | - | අභ්‍යන්තර විගණක (කමිටු රැස්කරවන්නා) |

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතවරුන්, සමාගමේ බාහිර විගණකවරුන් හා ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය  එහි සාමාජිකයින්ගේ ඇරැයුමෙන් නිරීක්ෂකයන් ලෙස කමිටු රැස්වීම් වලට සම්බන්ධ වේ.

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විධායක කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඇත.

# ආයතනික පාලනය

ප්‍රධාන අභ්‍යන්තර විගණක විවිධ කටයුතු වල කාර්යක්ෂමතාවය, අභ්‍යන්තර පාලනයේ සමාලෝචනය, ගිණුම්කරණ ප්‍රමිතිවල අනුකූලතාවය ආදිය පෙර සැලසුම් පදනම මත මූල්‍යමය හා පද්ධති විගණනයන් කර අනුකූලතාවයන් නොදක්වන වැරදි පිළිබඳ සභාපතිතුමා සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරමින් අදාළ කළමනාකරුවන් සම්බන්ධීකරණය කරමින් වැරදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

ඊට අමතරව විගණනය සමාලෝචනය කිරීමට හා විගණකවරුන්ගේ අරමුණ සහ ස්වාධීනත්වය තහවුරු කිරීමටත් විගණන කළමනාකරණ කමිටුව බාහිර විගණකවරුන් වන විගණකාධිපති දෙපාර්තමේන්තුව මුණ ගැසෙයි.

# අධ්‍යක්‍ෂවරුන්ගේ වාර්තාව

වර්ෂ 2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව විගණනය කරන ලද ගිණුම් වාර්තා සහ එදිනට ශේෂ පත්‍රය අධ්‍යක්ෂ මණ්ඩලය මෙසේ ඉදිරිපත් කරනුයේ ඉමහත් ප්‍රීතියෙනි.

## 1. සමාගමේ ක්‍රියාකාරකම්

සමාගමේ ප්‍රමුඛතම ක්‍රියාකාරකම වනුයේ පුවත්පත් මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත්කිරීම හා පුවත්පත් සහ සඟරා බෙදාහැරීමත්ය. මේ සම්බන්ධයෙන් සුවිශේෂී වෙනස්කම් සමාලෝචිත වර්ෂය තුළදී සිදු නොවිනි.

## 2. මූල්‍ය ප්‍රකාශනයන්

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇත.

## 3. විගණකවරුන්ගේ වාර්තාව

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව වාර්ෂික වාර්තාවේ පිටු අංක 23 දක්වා ඇත.

## 4. වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

මූල්‍ය වාර්තා සකස් කිරීමේදී වාර්ෂික වාර්තාවේ සඳහන් සුවිශේෂී වූ ගිණුම් ප්‍රතිපත්ති අනුගමනය කර ඇත.

## 5. වාර්ෂික සමාලෝචනය

මූල්‍ය වර්ෂයට අදාළව සමාගමේ ක්‍රියාවලි සමාලෝචනය සහ එහි ප්‍රතිඵලය සභාපතිතුමාගේ සමාලෝචනය හා මූල්‍ය සමාලෝචනය තුළ ඇතුළත් වේ.

## 6. ආදායම

වර්ෂ 2013 දෙසැම්බර් මස 31 දිනට අවසන් වන වර්ෂය සඳහා සමාගම ලැබූ ආදායම රුපියල් මිලියන 3,593 කි.

## 7. ලාභ සහ බෙදාහැරීම් (රුපියල් මිලියන)

| | 2013 | 2012 |
|---|---|---|
| බදු හා සාධාරණ වටිනාකම් වලට පෙර ලාභ/(අලාභ) | 73 | 57 |
| බදු | (12) | (6) |
| සාධාරණ අගය ගැළපීම | (2) | (59) |
| බදු අයකිරීමෙන් පසු ලාභ/(අලාභ) | 59 | (8) |
| පසුගිය වසරේ ඉදිරියට ගෙනා ලාභ/(අලාභ) | - | - |
| ලාභාංශ | - | - |
| ඉදිරියට ගෙන ගිය | | |
| රඳවාගත් ලාභය | 59 | (8) |

## 8. අයභාර සංචිත

2013 දෙසැම්බර් මස 31 දිනට සමාගමේ අයභාර සංචිත රුපියල් මිලියන 346.9 කි.

## 9. දේපළ පිරියත හා උපකරණ

2013 වර්ෂය තුළ සමාගම දේපළ පිරියත හා උපකරණ යන ප්‍රාග්ධන වියදම් සඳහා සහ නොනිම් ප්‍රාග්ධනය වෙනුවෙන් රු. මිලියන 40.7 ක් ආයෝජනය කර ඇත. වර්ෂය තුළ දේපළ, පිරියත හා උපකරණ වල වෙනස්වීම සටහන් අංක 06 යටතේ ඉදිරිපත් කර ඇත.

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

## 10. පරිත්‍යාග

සමාගම සමාලෝචන කාලය තුළ රු. මිලියන 2933 ක මුදලක් පුණ්‍යායතන සඳහා පරිත්‍යාග කොට ඇත.

## 11. කොටසක ශුද්ධ වත්කම

කොටසක ශුද්ධ වත්කම රුපියල් 109.57

## 12. කොටස් පිළිබඳ තොරතුරු

ලාභාංශ හා කොටසක ශුද්ධ වත්කම් වල ඉපයීමට අදාළ තොරතුරු සුවිශේෂී මූල්‍ය දත්තයන් හා දස අවුරුදු සාරාංශයන් යටතේ ඉදිරිපත් කර ඇත. කොටස් බෙදී ගොස් ඇති ආකාරය කොටස් පිළිබඳ තොරතුරු වාර්තාවේ ඇතුළත් වේ.

## 13. බහුතර කොටස් අයිතිය

ශ්‍රී ලංකා ජනරජය නියෝජනය වන අයුරින් 87.5% ක කොටස් බහුතරයක් මහා භාරකාරතුමා සතුව පවතී.

## 14. අධ්‍යක්ෂවරු

2013 දෙසැම්බර් 31 දිනට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඔවුන්ගේ කොටස් හිමිකම පහත දැක්වේ.

| | කොටස් ප්‍රමාණය |
|---|---|
| බන්දුල පද්මකුමාර මහතා | - |
| එදිරිසිංහ විතානගේ ප්‍රසාද් රසංග හරිස්චන්ද්‍ර මහතා | 1 |
| උපුල් රන්ජන් සමරසිංහ දිසානායක මහතා | - |
| සීලරත්න සෙනරත් මහතා | 1 |

## 15. වර්ෂය තුළ ඉල්ලා අස්වීම් / නව පත් කිරීම්

වර්ෂය තුළ දී අධ්‍යක්ෂ මණ්ඩලයට අලුතින් පත්කිරීමක් හෝ ඉවත්කිරීමක් සිදු වී නොමැත.

## 16. අධ්‍යක්ෂවරුන්ට දුන් ණය

ආයතනය අධ්‍යක්ෂවරුන්ට ණය ලබාදී නොමැත.

## 17. ගිවිසුම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම

2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂවරු සෘජුව හෝ වක්‍රව ආයතනයේ ගිවිසුම් සඳහා අත්සන් කොට හෝ ඉදිරි කාලයට අදාළ ගිවිසුම් සඳහා හෝ බැඳී නැත.

## 18. අධ්‍යක්ෂවරුන්ගේ දීමනා

2013 වර්ෂයේදී අධ්‍යක්ෂවරුන්ගේ දීමනා සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 19 යටතේ සඳහන් වේ.

## 19. ශේෂ පත්‍රය පිළියෙල කිරීමෙන් පසු සිදුවීම්

2013 දෙසැම්බර් 31 දිනට අවසන් වන වර්ෂය සඳහා ශේෂ පත්‍රය පිළියෙල කිරීමෙන් පසු ගිණුම් මගින් ගැළපුම් කිරීම සඳහා අවශ්‍යතාවයක් පැන නැගී නොමැත.

## 20. ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට හා සේවකයින්ට ගෙවන ලද සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත දිනට ගෙවා ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සෑහීමකට පත්වේ.

## 21. අඛණ්ඩ පැවැත්ම

ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය තරම් ප්‍රතිපාදන ඇති බවට අධ්‍යක්‍ෂ මණ්ඩලය සෑහීමකට පත්වේ. මේ හේතු නිසා මෙම ආයතනය මූල්‍යමය වාර්තා සැකසීමේදී "අඛණ්ඩ පැවැත්ම" පදනම අනුගමනය කරයි.

## 22. පාරිසරික ආරක්ෂණය

ආයතනය කිසිම අයුරකින් පරිසරය දූෂණය වන සහ පාරිසරික නීති පද්ධතියට අනුකූල නොවන කිසිම කටයුත්තකට සහභාගි නොවූ බවට අධ්‍යක්‍ෂ මණ්ඩලය ඔවුන්ගේ දැනුමේ හා විශ්වාසයේ හැටියට සෑහීමකට පත්වේ.

## 23. විගණකවරු

ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක 154 (3) ජේදය අනුව විගණකාධිපති විසින් වර්ෂයේ ගිණුම් විගණනය කර ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි



**කුමුදු එච්. ගුණවර්ධන ඉඹුලමුරේ**
**සමාගමේ ලේකම්**

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ විස්තර පහත දක්වා ඇත. විගණන වාර්තාව මගින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳව ඔවුන්ගේ වගකීම පෙන්වා දී ඇත.

2007 අංක 07 දරන සමාගම් පනත අනුව අධ්‍යක්ෂවරුන් විසින් එක් එක් මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතු අතර, එම ප්‍රකාශ ගිණුම් වර්ෂය අවසාන දිනට සමාගමේ තත්ත්වය සහ වර්ෂය තුළදී ලද ලාභය සත්‍ය හා සාධාරණ ලෙස පිළිබිඹු කළ යුතුය. මෙම ප්‍රකාශන පිළියෙල කිරීමේදී අධ්‍යක්ෂකවරුන් විසින් පහත සඳහන් කරුණු සහතික කළ යුතුය.

1. සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගෙන නොවෙනස්ව අනුගමනය කර ඇති බවත්, යම් ප්‍රමාණාත්මක බැහැර වීමක් ඇතොත් ඒවා හෙළිදරව් කර විස්තර කර ඇති බව,

2. අදාළ ගිණුම් ප්‍රතිපත්ති සියල්ල අනුගමනය කර ඇති බව,

3. තක්සේරු කිරීම් හා ගැළපීම් සාධාරණ සහ තහවුරු කළ හැකි බව,

4. මූල්‍ය වාර්තා සමාගම් පනත සමග අනුකූල වන බව සනාථ කිරීමට සහ සමාගමේ මූල්‍ය තත්ත්වය ප්‍රමාණවත් නිරවද්‍යතාවයකින් හෙළිදරව් කිරීමට අවශ්‍ය ගිණුම් වාර්තා ආයතනය පවත්වාගෙන යන බව සහතික කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීමයි. එමෙන්ම සමාගමේ වත්කම් ආරක්ෂා කිරීමට සහ මනා අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් පියවර ගැනීමට අධ්‍යක්ෂවරු වගකිව යුතු අතර, එමගින් වත්කම් වල ආරක්ෂාව සහ වංචා හා වැරදි වැළැක්වීම සහ සොයාගැනීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක වන බවට සහතික විය හැක.

5. අධ්‍යක්ෂවරු මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ වගකිව යුතු අතර, විගණකවරුන්ට විගණන වාර්තාව සකස් කිරීමට අවශ්‍ය සියලුම පහසුකම් ලබාදීම, ඔවුන්ට අවශ්‍ය පරිදි පරීක්ෂා කිරීම් කටයුතු සැලසීම අධ්‍යක්ෂවරුන්ගෙන් සිදුවිය යුතුය.

මෙම වාර්තාවේ සඳහන් පරිදි අධ්‍යක්ෂවරුන්ගේ වගකීම ඔවුන් නොපිරිහෙලා ඉටුකර ඇති බව ඔවුන්ගේ අදහසයි.

ආයතනයේ විගණකවරුන් වන විගණකාධිපති තුමා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට ලබා දෙන ලද මූල්‍ය ප්‍රකාශන සමග ගිණුම්කරණ වාර්තා, අදාළ තොරතුරු කොටස් හිමියන්ගේ සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පරීක්ෂා කර බලා ඔවුන්ගේ මතය මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති විගණන වාර්තාවේ ඉදිරිපත් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම,
**කුමුදු එච්. ගුණවර්ධන ඉඹුලමුරේ**
**සමාගමේ ලේකම්.**

සභාපති,
ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

## ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් සාරාංශගත ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවලින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 28 දරන සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (විශේෂ විධිවිධාන) පනතේ 16 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සමාගමේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සමාගමේ සභාපති වෙත යථා කාලයේ දී නිකුත් කරනු ලැබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසාය සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLAS for SME'S) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකයේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් පිළිබඳව උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. (තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ). එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

සමාගමේ සම්පූර්ණ හිමිකම් සහිත පරිපාලිතයන් වන සීමාසහිත ලේක්හවුස් ප්‍රොපටි ඩිවොලොප්මන්ට් (පෞද්ගලික) සමාගම. සීමාසහිත ඉන්ෆො මීඩියා (පෞද්ගලික) සමාගම සහ සීමාසහිත බිස්නස් ලංකා (පෞද්ගලික) සමාගම් යන සම්පූර්ණ හිමිකම් සහිත පරිපාලිතයන්හි මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට යොදාගෙන තිබුණි.

#### 2.2.2 සමාගමේ අඛණ්ඩ පැවැත්ම

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියෙහි 3.8 වගන්තියෙහි දක්වා ඇති පරිදි සමාගමෙහි ව්‍යාපාර කටයුතු අඛණ්ඩව කරගෙන යාමේ හැකියාව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අඛණ්ඩ පැවැත්ම පදනම්ව එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම් කළමනාකාරිත්වය විසින් තහවුරු කරගෙන නොතිබුණි. සමාගමේ පැවැත්මට තර්ජනයක් ඇතිවිය හැකි පරිදි, පසුගිය වර්ෂ 5 ක කාලය තුළ සමාගමේ ශුද්ධ වත්කම් සියයට 32 කින් පමණ අඩු වී තිබුණු බව තවදුරුටත් නිරීක්ෂණය විය. සීමාසහිත ඉන්ෆොමීඩියා (පෞද්ගලික) සමාගම අඛණ්ඩව පවතින බවට වූ උපකල්පනය මත පදනම්ව එම සමාගමේ මූල්‍ය ප්‍රකාශන සමාගම සමග ඒකාබද්ධ කර තිබුණ ද පසුගිය වර්ෂ දෙක තුළ දරන ලද විශාල අලාභ හේතුවෙන් හා එහි ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ වත්කම් ඍණ ලෙස පිරිහී තිබීම ද හේතුවෙන් එම සමාගමේ වාණිජ මෙහෙයුම් කටයුතු, ඉකුත් වර්ෂයේ දී නතර කර තිබුණ- බව නිරීක්ෂණය විය.

#### 2.2.3 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (කු.ම.ව්‍ය.) සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ). 23.10 වගන්තිය - සමාගමේ වාර්ෂික ප්‍රකාශන අංශයෙන් ලැබිය යුතු ආදායම සමාගම විසින් හඳුනාගෙන නොතිබුණි.

(ආ). 20.13 වගන්තිය - කල්බදු පදනම මත ලබාගෙන සමාගම විසින් අත්පත් කරගනු ලැබූ ගිණුම්කරණ මෘදුකාංග පැකේජයේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර, එය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ද නොතිබුණි.

(ඈ). 20.09 වගන්තිය - සමාගම පවත්වාගෙන යනු ලබන ඩී.ආර්. විජේවර්ධන මාවතේ පිහිටි ඉඩමේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. ආරම්භයේ සිටම මෙම ඉඩම මෙහෙයුම් කල් බදුකරයක් ලෙස දක්වා ඇති බවත් කල්බදු සම්බන්ධව කරනු ලබන ගෙවීම කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට වාර්ෂිකව ගෙවනු ලබන රු. 8,966 ක මුදල පමණක් බවත් 2014 ජූලි 29 දින සභාපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

(ඉ). 8.5 වගන්තිය - සමාගමේ බොල් සහ අඩමාණ ණය වෙන්කිරීම් වෙනුවෙන් අනුගමනය කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඊ). 33.9 වගන්තිය - සීමාසහිත ලේක්හවුස් දේපල සංවර්ධන (පෞද්ගලික) සමාගමට පෙර අයත්ව තිබුණු දේපල උකසට තබා සමාගම විසින් වාණිජ බැංකුවකින් රු. මිලියන 175 ක ණය මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී ලබාගෙන තිබුණි. එසේ වුවත්, මෙය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ). ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සටහන්වල ආදායම් හඳුනාගැනීම පිළිබඳ ගිණුම් ප්‍රතිපත්තියට අනුකූලව සංසරණය වන පුවත්පත්වලින් ප්‍රතික්ෂේපිත පුවත්පත්වල වටිනාකම සමාලෝචිත වර්ෂයේ ආරම්භයට සහ අවසානයට ගලපා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 3,652,341 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ). සමාගමේ නඩත්තු දෙපාර්තමේන්තුව විසින් නිපදවන ලද හා අනෙකුත් අංශවලට භාරදෙන ලද ප්‍රාග්ධන වත්කම් විෂයයන් 16 කට අදාළ වියදම් ප්‍රාග්ධනිත කරනු වෙනුවට වියදම් වශයෙන් කපා හැර තිබුණි. තවද මෙම වත්කම්වල පිරිවැය විස්තර විගණනයට ලබා දී නොතිබුණි.

(ඇ). සමාගමේ වාර්ෂික ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළදී පොත් මුද්‍රණය වෙනුවෙන් රු. 2,453,125 ක මුදලක් වැයකර තිබුණි. එසේ වුවත් 2013 දෙසැම්බර් 31 දිනට අලෙවි නොකළ පොත්වල වටිනාකම තහවුරුකර ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ). විගණනයට ලබාගත හැකි වූ තොරතුරු වලට අනුව, වර්ෂයකට වැඩි කාලයක් හිඟ හිටි ණයගැති ශේෂයන්ට සමාන මුදලක් බොල් හා අඩමාණ ණය වශයෙන් වෙන්කර තිබුණි. එසේ වුව ද සමාගම ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව බොල් හා අඩමාණ ණය සඳහා වෙන් කිරීම් සිදුකර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස බොල් හා අඩමාණ ණය වෙන්කිරීම් රු. 14,452,315 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.5 පැහැදිලි නොකරන ලද වෙනස්කම්

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). තොග විෂයයන් 13 කට අදාළව ලෙජර ශේෂයන්හි වටිනාකම සහ සැසඳීම් සිදුකර භෞතිකව සත්‍යාපනය කරන ලද තොග වටිනාකම් අතර එකතුව රු. 4,050,364 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙයට අමතරව, තොග විෂයයන් 8 කට අදාළව ලෙජර ශේෂයන්හි වටිනාකම සහ සැසඳීම සිදු නොකර භෞතිකව සත්‍යාපනය කරන ලද තොග වටිනාකම් අතර එකතුව රු. 3,967,520 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ). ණයගැති ලෙජර ශේෂ හා ඊට අනුරූපීව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අගයන් අතර රු. 680,270 ක හර ශේෂ වෙනසක් හා රු. 191,762 ක බැර ශේෂ වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ). 2013 දෙසැම්බර් 31 දිනට සමාගමේ වාර්තා අනුව අයවිය යුතු සේවක ණය ශේෂ හා ඊට අදාළව සේවක අර්ථසාධක අරමුදල මගින් විගණනයට ඉදිරිපත් කළ අගයන් අතර රු. 588,715 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ). වටිනාකම රු. 9,490,377 ක් වූ අගරු වූ චෙක්පත් 185 ක් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. විගණනයට ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව, මෙම චෙක්පත් වලින් රු. 4,693,656 ක් වටිනා චෙක්පත් 116 ක් වර්ෂයකට වඩා වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(ආ). රු. 645,835,280 ක් වටිනා වෙළඳ ණයගැතියන්ට අදාළව ශේෂ සනාථ කිරීම් කැඳවා තිබූ අතර එයින් රු. 19,773,464 ක් සඳහා සම්පූර්ණයෙන් එකඟ වී තිබුණි. මේ අතර ණයගැතියන් වටිනාකම රු. 7,805,803 ක් වූ ප්‍රමාණයකට එකග වී නොතිබුණ අතර 2014 අප්‍රේල් 30 දින දක්වා ඉතිරි ශේෂය වූ රු. 618,256,509 ක් සඳහා සනාථ කිරීම් ලැබී නොතිබුණි. තවද වටිනාකම රු. 35,290,509 ක් වූ සනාථ කිරීම් කැඳවීමේ ලිපි හරවා එවා තිබුණි.

(ඇ). වර්ෂයකට වඩා වැඩි කාලයක සිට ලැබිය යුතු වෙළඳ ණයගැතියන් යටතේ රු. 65,464,439 ක මුදලක් දක්වා තිබුණි. මෙම ශේෂයෙන් සියයට 31 ක් හෙවත් රු. 20,726,548 ක් අයකරගත නොහැකි ණය ලෙස සලකා නීති අංශයට යොමුකර තිබුණි.

(ඈ). රු. 69,863 ක් සහ රු. 1,037,572 ක් වූ පිළිවෙලින් හඳුනා නොගත් හර හා බැර ශේෂයන් නිරවුල් කිරීමකින් තොරව මාස 6 කට වැඩි කාලයක් සමාගමේ බැංකු ගිණුම් හයක පැවැතුණි.

### 2.2.7 විගණනය සඳහා සාක්ෂි නොවීම

ඉඩම් හා ගොඩනැගිලි හැර සමාගම සතු ස්ථාවර වත්කම් ප්‍රමාණය රු. 320,028,287 ක් වූ අතර මෙම වත්කම්වල පැවැත්ම තහවුරු කිරීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් හෝ සත්‍යාපන වාර්තා සමාගම විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 13(5) (ඈ) වගන්තිය | අර්ධ වාර්ෂික අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 114(1) වගන්තිය සහ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.7 ඡේදය | ප්‍රසාද දීමනාවලට අදාළ උපයන විට ගෙවීමේ බදු සේවකයින්ගේ වැටුපෙන් අඩු නොකර සමාගම විසින් දරා රු. 5,025,678 ක මුදලක් උපයන විට ගෙවීම් බදු ලෙස ගෙවා තිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක. පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය : | |
| | (i) 9.2 (ආ) ඡේදය | සංවිධාන සටහනට සහ අනුමත කාර්ය මණ්ඩලයට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු නමුත් එසේ ලබාගෙන නොතිබුණි. |
| | (ii) 9.2 (අ) ඡේදය | සමාගමේ අනුමත කාර්ය මණ්ඩලය සංයුක්ත සැලැස්මේ ඇතුළත් කළ යුතු නමුත් 2006 ජූලි 31 දිනට සහ 2013 නොවැම්බර් 30 දිනට වූ තථ්‍ය කාර්ය මණ්ඩලය 2016 සිට 2015 දක්වා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට ඇතුළත් කර තිබුණි. |
| | (iii) 9.3.1 ඡේදය | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ සහ මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව අධ්‍යක්ෂ මණ්ඩලය සහ අදාළ අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද බඳවාගැනීම් යෝජනා ක්‍රමයක් සහ සෑම තනතුරකටම අදාළ උසස්වීම් පරිපාටියක් සියලු රාජ්‍ය ව්‍යවසායකටම තිබිය යුතුය. කෙසේ වුවද, එසේ අනුමත කරන ලද බඳවාගැනීම් යෝජනා ක්‍රමයක් හෝ උසස්වීමේ පරිපාටියක් සමාගම සඳහා නොතිබුණි. ඒ හේතුවෙන් ඉහළ කළමනාකරණ තනතුරු සඳහා අවශ්‍ය වන නිශ්චිත අධ්‍යාපනික හා වෘත්තීමය සුදුසුකම් තීරණය කිරීමට සමාගමට නොහැකි වී තිබුණි. |
| (ඈ) | 2011 සැප්තැම්බර් 15 දිනැති අංක 58(2) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.5 ඡේදය | සමාගමේ නිලධාරීන්ට ප්‍රවාහන දීමනා, ඉන්ධන දීමනා, රියදුරු දීමනා සහ ප්‍රවාහන පහසුකම් සඳහා කුලී පදනමට වාහන ලබාදීමට තීරණය කිරීමේදී මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ එකඟත්වය ලබාගෙන නොතිබූ අතර ඉහත කාරණයන් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී සමාගම විසින් රු. 70,407,461 ක මුදලක් වැය කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය, රු 2,034,813 ක් වූ සාධාරණ අගය ගැලපීමට පෙර රු. 73,072,209 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා රු. 59,928,374 ක් වූ සාධාරණ අගය ගැලපීමට පෙර බදු පූර්ව ශුද්ධ ලාභය රු. 57,429,835 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 15,642,375 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. වාණිජ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ශුද්ධ ආදායම වැඩිවීම සහ පුවත්පත් සහ වාර සඟරාවල විකුණුම් පිරිවැය අඩුවීම සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයෙහි වැඩි වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ සමාගමේ දළ ලාභ ආන්තිකය හා ලාභ අධිකය ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී පිළිවෙලින් සියයට 1.74 කින් හා සියයට 6.22 කින් වැඩිවීමක් විය. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විග්‍රහාත්මක සමාලෝචනයේදී අනාවරණය වූ ඇතැම් කරුණු ඉකුත් වර්ෂය හා සසඳා පහත දැක්වේ.

| | 2013 | 2012 | විචලනය (හිතකර/අහිතකර) |
|---|---|---|---|
| | (%) | (%) | (%) |
| දළ ලාභ ආන්තිකය | 47.86 | 46.12 | 1.74 |
| ලාභ අධිකය (විකුණුම් පිරිවැය මත දළ ලාභය) | 91.81 | 85.59 | 6.22 |
| පිරිවැටුම මත පරිපාලන පිරිවැය | 36.74 | 34.84 | 1.90 |
| පිරිවැටුම මත විකුණුම් හා බෙදාහැරීම් පිරිවැය | 9.07 | 8.74 | 0.33 |
| පිරිවැටුම මත මූල්‍ය පිරිවැය | 3.86 | 3.84 | 0.02 |
| ද්‍රවශීලතා අනුපාතය (වාර ගණන) | 1.59 | 1.41 | 0.18 |
| ක්ෂණික අනුපාතය (වාර ගණන) | 1.13 | 1.00 | 0.13 |

## 3.3 සමාගමට එරෙහිව පවරා ඇති නඩු

ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාගමට එරෙහිව ඇති නඩු 70 ක් විභාග වෙමින් පවතින අතර ඒ සඳහා විනිශ්චයක් අපේක්ෂාවෙන් සිටී. විභාග වෙමින් පවතින නඩු සම්බන්ධව වැඩිදුර විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එසේ වුවත් මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂයේ දී රු. 1,611.200 ක මුදලක් අසම්භාව්‍ය වගකීම ලෙස වෙන්කර තිබුණි.

## 3.4 කාරක ප්‍රාග්ධන කමනාකරණය

කාර්යක්ෂම ණය අයකරගැනීමේ පිළිවෙතක් සහ නිසි කාරක ප්‍රාග්ධන කළමනාකරණ ප්‍රතිපත්තියක් නොමැතිවීම නිසා සමාලෝචිත වර්ෂයේ දී සමාගමේ කාරක ප්‍රාග්ධන තත්ත්වය පිරිහී තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් කාරක ප්‍රාග්ධන ගැටලු නිරාකරණය කරගැනීම සඳහා සමාගම විසින් රු. මිලියන 175 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. දළ වශයෙන් සියයට 10 ක පමණ පොලියක් සමග රු. මිලියන 3 බැගින් වූ මාසික වාරිකවලින් ණය මුදල ආපසු ගෙවිය යුතුය. දිගුකාලීන ණය මගින් කෙටිකාලීන කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීමේ යෝග්‍යතාවය කළමනාකරණය විසින් ඇගයීමට ලක්කර නොතිබුණි. මෙයට අමතරව සමාලෝචිත වර්ෂය තුළදී සමාගම විසින් රු. මිලියන 38.4 ක මුදලක් බැංකු අයිරා පොලී ලෙස ගෙවා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ). සමාගම සමාලෝචිත වර්ෂයේ දී පුවත්පත් 06 ක්, වාර සඟරා 22 ක් සහ වාර්ෂික ප්‍රකාශන 03 ක් ප්‍රසිද්ධ කර තිබුණු අතර, ඉකුත් වර්ෂයේදී පුවත්පත් 06 ක්, වාර සඟරා 16 ක් සහ වාර්ෂික ප්‍රකාශන 02 ක් ප්‍රසිද්ධ කර තිබුණි. ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ දී පුවත්පත්, වාර සඟරා සහ වාර්ෂික ප්‍රකාශනවල ශුද්ධ දායකය රු. මිලියන 15.6 කින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී සමාගම විසින් වාර සඟරා 6 ක් හඳුන්වා දී තිබුණ ද, ඒවා සියල්ලන්ගෙන්ම රු. මිලියන 5.127 ක සෘණ දායකත්වයක් ලැබී තිබුණි.

(ආ) සමාගම පළකල පුවත්පත් 06 මගින් සමාගමේ, මූල්‍ය ප්‍රතිඵලවලට වාසිදායක දායකත්වයක් ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

(i) සමාගමේ සමස්ත පුවත්පත් දැන්වීම් ආදායම, ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී රු. මිලියන 15.8 කින් හෙවත් සියයට 0.7 කින් අඩු වී තිබුණු අතර සමාගම සමාලෝචිත වර්ෂය තුළදී ගාස්තු සංශෝධනය කර නොතිබුණි.

(ii) සමාගමේ සමස්ත පුවත්පත් විකුණුම් ආදායම, ඉකුත් වර්ෂයේ රු. මිලියන 421.4 සිට සමාලෝචින වර්ෂයේ දී රු. මිලියන 408.9 ක් දක්වා සියයට 3 කින් අඩු වී තිබුණු අතර, එක් පුවත්පතක මිල ගණන් 2013 ජනවාරි 06 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියයට 20 කින් වැඩිකර තිබුණි. ප්‍රකාශන 28 ක්, පරිපාලිත සමාගම් 3 ක්, වාණිජ මුද්‍රණ කටයුතු, වාර්ෂික ප්‍රකාශන සහ අංකන මුද්‍රණ කටයුතු, විශේෂයෙන් විගණන මතය ඉදිරිපත් කරනු ලබන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අයත්වන සමූහය විසින් කරගෙන යන බවත්, මූලික වශයෙන් වාණිජ මුද්‍රණ කටයුතුවල ආදායම රු. මිලියන 124 කින් අඩුවීම නිසා සමූහයේ පිරිවැටුම රු. මිලියන 107 කින් අඩු වූ බවත්, මේ අනුව වාණිජ මුද්‍රණ කටයුතු හැරුණ- විට සමූහයේ පිරිවැටුම වැඩි වී ඇති බවත් 2014 ජූලි 29 දින සමාගමේ සභාපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී සමාගමේ පරිපාලිත සමාගමක් ලෙස ලියාපදිංචි වී කර තිබුණු සීමාසහිත බිස්නස් ලංකා ඒ එන් (පෞද්ගලික) සමාගම රු. මිලියන 16 ක ආදායමක් උපයා තිබුණි. එසේ වුවත් මුළු ආදායමෙන් ණයගැතියන් රු. මිලියන 9.9 ක් හෙවත් සියයට 62 ක් 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණි. 2014 අප්‍රේල් 30 දිනට සකස් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ණයගැතියන්ගෙන් රු. 1,296,960 ක් වර්ෂයකට වැඩි කාලයක සිට අයවිය යුතුව තිබුණි.

(ආ) සියයට 15 ක නියෝජිත කොමිස් මුදලට අමතරව, වෙළඳ දැන්වීම් නියෝජිතයින් මගින් ලැබෙන දැන්වීම් ආකර්ෂණය කරගැනීමේ අරමුණින් එම නියෝජිතයින් සඳහා 2012 වර්ෂයේ දී දිරි දීමනා ක්‍රමයක් ද හඳුන්වා දී තිබුණි. එසේ වුවත්, වෙළඳ දැන්වීම්වලට අදාළ ණයගැති ශේෂ අයකර ගැනීමට එම නියෝජිතයින් කිසිදු වගකීමක් ගෙන නොතිබුණි. මෙම කරුණු යටතේ මෙම ණයගැති ශේෂ අයකර ගැනීමේ තත්ත්වය අවිනිශ්චිත විය. වෙළඳ දැන්වීම් වෙනුවෙන් ලැබිය යුතු වර්ෂයකට වඩා වැඩි ණය ප්‍රමාණය රු. 12,917,653 ක් බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ඇ) පුවත්පත් නියෝජිතයින් විසින් තැන්පත් කළ යුතු අවම තැන්පත් මුදල සමාගම විසින් වර්ෂ ගනනාවක සිට සංශෝධනය කර නොතිබුණි. නියෝජිතයින්ගෙන් සමාගමට ලැබිය යුතු මුදල ඔවුන්ගේ තැන්පත් මුදල ඉක්මවා තිබුණු බව නිරීක්ෂණය විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඇතැම් නියෝජිතයින් අත්හිටුවීම, අවසන් කිරීම හෝ නීතිමය ක්‍රියාමාර්ග සඳහා විශ්‍රාම ගැන්වීම් සිදුකර තිබුණි.

(ඈ) 2013 දෙසැම්බර් 31 දිනට වූ ණයගැති ශේෂයෙන් රු. 53,445,776 ක මුදලක් දැන්වීම් නියෝජිතයින් මගින් ලද දැන්වීම් සඳහා රාජ්‍ය ආයතන 104 කින් ලැබිය යුතු ශේෂයන් විය. මේ සම්බන්ධයෙන් සමාගම විසින් රු. 9,431,607 ක් කොමිස් මුදල් ලෙස නියෝජිතයින්ට ගෙවා තිබුණි. එසේ වුවත්, රජයට අයත් වෙළඳ ව්‍යාපාරික ආයතනයක් ලෙස රජයේ වෙළඳ දැන්වීම් සෘජුවම ආකර්ෂණය කරගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලකට අවශ්‍ය පියවර සමාගම ගෙන නොතිබුණි.

(ඉ) පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් නොකිරීම, ඵලදායී නොවූ ප්‍රවර්ධන වැඩසටහන් සහ බෙදාහැරීම් පද්ධතියේ දුර්වලතාවයන් යනාදිය හේතුවෙන් වාර්ෂික ප්‍රකාශන දෙපාර්තමේන්තුව අඛණ්ඩව අලාභ දරා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළදීත් රු. මිලියන 4.8 ක ආලාභයක් ලබා තිබුණි.

(ඊ) පසුගිය වර්ෂ කිහිපය තුළ සැලකිය යුතු ලෙස දක්නට තිබුණු හැර වූ විකුණුම් අවම කරගැනීමේ අරමුණින් සමාගම විසින් වරින්වර හැර වූ විකුණුම් සඳහා වූ අනුපාත ක්‍රමයක් එක් එක් පුවත්පත් සඳහා හඳුන්වා දී තිබුණි. එසේ වුවත් නව පද්ධතිය හඳුන්වාදීමෙන් පසුව, සමාලෝචිත වර්ෂය තුලදී සමස්ත හැර වූ විකුණුම් ප්‍රමාණය රු. 35,177,498 කින් හෙවත් සියයට 41 කින් වර්ධනයවී තිබුණි.

(උ) කඩදාසි රීල් මුද්‍රණ කටයුතු සඳහා යොදාගැනීමට පෙර ඒවා කැපීම සඳහා බාහිර සමාගමක් වෙත සාමාන්‍ය කාර්යයන් ලෙස යවා තිබුණි. කැපීම සඳහා යවන ලද කඩදාසි රීල් වල බර ප්‍රමාණය සහ කැපීමෙන් පසුව ලැබී තිබුණු කඩදාසි රීල්වල බර ප්‍රමාණයෙහි විචලනය අදාළ වාර්තා නොතිබීම නිසා විගණනයේ දී සත්‍යාපනය කළ නොහැකි විය. 2013 දෙසැම්බර් 20 දින සිට 2014 පෙබරවාරි 25 දින දක්වා වූ කාලය තුළ කැපීම සඳහා යවා තිබුණු සහ කැපීමෙන් පසුව ලැබී තිබුණි කඩදාසි රීල්වල බර ප්‍රමාණයන් පිළිවෙලින් කි.ග්‍රෑ. 44,375 ක් හා කි.ග්‍රෑ. 38,567 ක් විය. මේ අනුව, කැපීම සඳහා යවන ලද කඩදාසිවල අසාමාන්‍ය අපතය කි.ග්‍රෑ. 5808 ක් හෙවත් සියයට 13 ක් විය . එසේ වුවත්, කළමනාකරණය මෙම අලාභය අවම කර ගැනීම සඳහා විධිමත් අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

### 4.3 මෙහෙයුම් ආකාර්යක්මෂතා

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව, "තිනකරන්" සහ "වන්නවනවිල්" පුවත්පත් ප්‍රවර්ධනය කිරීම සඳහා කිලිනොච්චි දිස්ත්‍රික්කයේ වෙනම ශාඛාවක් ස්ථාපනය කර තිබුණි. මෙම නව ශාඛාව ස්ථාපනය කිරීමෙන් පසුව මෙම පුවත්පත් දෙකෙහි අලෙවිය අඩු වී තිබුණි. මෙම ශාඛාවෙන් කිසිදු සේවාවක් ලබාගැනීමෙන් තොරව සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළදී සහ ඉකුත් වර්ෂයේදී පිළිවෙලින් රු. 628,500 ක් සහ රු. 854,749 ක් වැටුප් හා වේතන ලෙස වැයකර තිබුණි.

(ආ) රු. 1,680,000 කට ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රයක් මිලට ගෙන වෙනම ඩිජිටල් මුද්‍රණ අංශයක් ඉකුත් වර්ෂයේ ආරම්භ කර තිබුණි. විගණනයට ලැබුණු තොරතුරුවලට අනුව මෙම අංශයේ මෙහෙයුම්වලින් සමාලෝචිත වර්ෂය තුළදී ලබාතිබුණු අලාභය රු. 867,262 ක් විය.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ප්‍රචාරක නියෝජිතයන් එකතු කරනු ලබන ප්‍රචාරක දැන්වීම් වටිනාකම මත ගෙවනු ලබන සියයට 1 සිට සියයට 55 දක්වා වූ වට්ටම්වලට අමතරව. අපේක්ෂිත ඉලක්ක සපුරාගනු ලබන නියෝජිතයින් සඳහා දිරි දීමනා යෝජනා ක්‍රමයක් ද අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව 2012 වර්ෂයේ දී සමාගම විසින් හඳුන්වා දී තිබුණි. මෙම යෝජිත දිරි දීමනා ක්‍රමය යටතේ 2012 සහ 2013 වර්ෂවලදී පිළිවෙලින් රු. 2,196,577 ක් සහ රු. 12,491,960 ක් ගෙවා තිබුණි. එසේවුවත්, සමාගම සමාලෝචිත වර්ෂයේ දී හා පෙර වර්ෂයේ දී දිරි දීමනා ලෙස රු. 14,688,537 ක අමතර වියදමක් දරා තිබුණ ද ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී මුළු ප්‍රචාරක දැන්වීම් ආදායම රු. 15,755,000 කින් අඩු වී තිබුණි. මෙම නිසා දිරි දීමනා යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම ප්‍රශ්න කාරී වේ. වෙළඳපොළ කොටස පවත්වාගෙන යාම සඳහා අනාගතයේ දීත් දිරි දීමනා ගෙවීම් යෝජනාක්‍රමය අඛණ්ඩව පවත්වාගත යුතු බවත්, එබැවින් දිරි දීමනා ගෙවීම් යෝජනාක්‍රම හඳුන්වාදීම ව්‍යාපාර මෙහෙයුම් සඳහා අත්‍යාවශ්‍ය වන බවත් 2014 ජූලි 29 දින සමාගමේ සභාපතිවරයා විසින් මා වෙත දන්වා එවා තිබුණි.

## 4.5 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුවරු සකස් කිරීමේ යන්ත්‍රයක් සහ කැමරා උපකරණ හා උපාංග සහ වෙනත් උපකරණ යනාදී විෂයයන් එකසිය හැත්තෑ එකක් අපහරණය කිරීමට ලේඛනගත කර තිබුණ ද, වාණිජ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සහ ඡායාරූප සංස්කරණ සේවා අංශයේ වර්ෂ දෙකකට වැඩි කාලයක සිට අපහරණය කිරීමෙන් තොරව රඳවාගෙන තිබුණි මෙම විෂයයන්වල වටිනාකම විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සීමාසහිත ඉන්ෆෝ මීඩියා (පෞද්ගලික) සමාගම විසින් පුවත්පත් මුද්‍රණය සඳහා භාවිතා කර තිබුණු "Heidelberg Sordz" යන්ත්‍රය වර්ෂ දෙකකට වැඩි කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. තක්සේරු වාර්තාවට අනුව යන්ත්‍රයේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 5.5 ක් විය.

(ඇ) සීමාසහිත ලේක්හවුස් ප්‍රොපටි ඩිවලොප්මන්ට් (පෞද්ගලික) සමාගමට අයත්ව තිබූ හෝකන්දර පිහිටි අක්කර 8 ක වපසරියකින් යුත් ඉඩම 1985 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි. මෙම ඉඩමේ වටිනාකම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 4.6 ආර්ථික නොවූ ගනුදෙනු

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 13 දින අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයකට අනුව, සමාගම සඳහා වාහන අංගනයක් ඉදිකිරීමට මසකට රු. 143,000 ක කුලියක් ගෙවීමේ ගිවිසුමක් මත දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ඉඩමක් ලබාගෙන තිබුණි. එසේ වුවත්, කුලිය වශයෙන් රු. 715,000 ක් ගෙවීමෙන් පසුව, එවැනි වාහන අංගනයක් ඉදිකිරීමකින් තොරව අදාළ ඉඩම නැවත දුම්රිය දෙපාර්තමේන්තුවට පවරා තිබුණි.

(ආ) "දැනමුතු" සඟරාවේ ප්‍රධාන කෘතවරයාගේ උපදෙස් අනුව, සමාලෝචිත වර්ෂයේ දී පොත් 7 කින් පිටපත් 21,000 ක් මුද්‍රණය කර තිබුණි. එසේවුවත්, අධි ඇස්තමේන්තු කිරීම හේතුවෙන් රු. 951,440 ක් වටිනා පොත් පිටපත් 13,592 ක් 2013 සැප්තැම්බර් මාසයේ සිට ගබඩාවල පැවතුණි.

(ඇ) මුද්‍රණ කඩදාසි මෙට්‍රික්ටොන් 49 ක් ප්‍රවාහනය කිරීමේ අරමුණින් ප්‍රවාහන යන්ත්‍රයක් (Prime Mover) මෙහෙයුම් කල් බදු යටතේ, රු. මිලියන 4.8 ක් වැයකර සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණි. එසේ වුවත්, වර්තමානයේ දී මුද්‍රණ කඩදාසි මෙට්‍රික්ටොන් 6 ක් පමණක් මෙම වාහනය යොදාගෙන ප්‍රවාහනය කරනු ලැබේ. එබැවින් අපේක්ෂිත ඉතිරිය මෙම වියදම් මගින් ලබාගත නොහැකි වී තිබුණි.

(ඈ) සමාගම විසින් සමාගම් කිහිපයක දිගුකාලීන මූල්‍ය වත්කම්වල (කොටස් ප්‍රාග්ධනය) ආයෝජනයන් කිහිපයක් කර තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට ආයෝජන කළ මෙහි වටිනාකම රු. 135,362,000 ක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ දී හා ඉකුත් වර්ෂයේ දී ආයෝජනය මත ප්‍රතිලාභය සියයට 1.4 සිට සියයට 1.5 දක්වා පරාසයක විය.

(ii) 2008 වර්ෂයේ දී ලංකා පුවත් සමාගමේ රු. මිලියන 1.2 ක් ආයෝජනය කර තිබුණ ද, 2014 මැයි 31 දින දක්වා මෙම ආයෝජනය මත කිසිදු ප්‍රතිලාභයක් සමාගමට ලැබී නොතිබුණි.

වර්ෂ කිහිපයකට පෙර සිදුකරන ලද මෙකී ආයෝජනවල පිරිවැය රු. මිලියන 1 ක් වූ බවත් ශේෂ පත්‍ර දිනට වූ වෙළඳපොළ වටිනාකම රු. මිලියන 134.4 ක් බවත්, නාමික අගය මත ලැබී තිබුණු ලාභාංශ අඩු වුව ද ප්‍රතිලාභවල පැහැදිලි වර්ධනයක් මෙම තත්ත්වය මත පැහැදිලිව පෙන්නුම් කරන බවත්, සමාගමේ සභාපතිවරයා විසින් 2014 ජූලි 29 දින අපගේ පළමු නිරීක්ෂණය සම්බන්ධයෙන් මා වෙත වාර්තා කර තිබුණි.

## 4.7 හඳුනාගත් පාඩු

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය ආයතනයකින් ලැබිය යුතු රු. 43,447,015 ක මුදලක් අයකර ගැනීම සඳහා සමාගම විසින් එම ආයතනයට එරෙහිව නඩු පවරා තිබුණි. එසේ වුවත්, අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය මත මෙම නඩුව ඉල්ලා අස්කර ගෙන තිබුණි අතර එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ණයගැතියාට අදාළව ප්‍රතිපූර්ණය කළ යුතු ශුද්ධ එකතු කළ අගය මත බදු (VAT) සමාගම අහිමි කරගෙන තිබුණි.

(ආ) සම්පූර්ණ අයිතිය ඇති පරිපාලිත සමාගමක් වන සීමාසහිත ඉන්ෆෝ මීඩියා (පෞද්ගලික) සමාගම එහි මෙහෙයුම් කටයුතු 2012 වර්ෂයේ සිට අත්හිටුවා ඇති අතර එහි සමුච්චිත අලාභය රු. 6,993,757 ක් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ආයෝජනය කරන ලද ප්‍රාග්ධනය හා ලබා දී තිබූ අතිරේක අරමුදල් රු. 6,313,833 ක් සමාගමට අහිමි වී තිබුණි.

## 4.8 සමාගමේ මානව හා භෞතික සම්පත් අනෙකුත් ආයතනවලට මුදාහැරීම

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක. පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව සමාගම විසින් කුලියට ලබාගත් වාහන 4 ක් වෙනත් රාජ්‍ය ආයතනවලට මුදාහැර තිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළදී සමාගම විසින් රු. 2,520,000ක මුදලක් වාහන කුලී වශයෙන් වැයකර තිබුණි.

(ආ) වාර්ෂික ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සහකාර කළමනාකරුවෙකු ඇතුලු නිලධාරීන් තිදෙනෙකු වෙනත් බාහිර ආයතනයක සේවය සඳහා මුදාහැර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුලදී සමාගම විසින් වැටුප් හා වේතන සහ ප්‍රවාහන දීමනා ලෙස රු. 2,256,098 ක මුදලක් වැයකර තිබුණි.

### 4.9 සේවක මණ්ඩල කළමනාකරණය

පහත නිරීක්ෂණ කරනු ලැබේ

(අ) 2014 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා කාර්ය මණ්ඩලයට 133 දෙනෙකු බඳවාගෙන තිබුණ ද, මෙම බඳවාගැනීම් සඳහා නියමිත අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) විගණනයට ලැබුණු තොරතුරුවලට අනුව, ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ සහ අධ්‍යක්ෂකවරුන්ගේ වැටුප් හා වේතන සමාලෝචිත වර්ෂය තුළදී පිළිවෙලින් සියයට 5.2 කින් සහ සියයට 108 කින් වැඩිකර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5. 1 සංයුක්ත සැලැස්ම

2013 ජුනි 02 දිනැති අංක. පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 වගන්තිය ප්‍රකාරව සමාගම විසින් 2013 - 2016 කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙළ කර තිබුණි. එසේ වුවත්, සංයුක්ත අරමුණු ළඟාකරගැනීම සම්බන්ධයෙන් විශේෂයෙන්ම වෙළඳපොලෙහි ඇති ප්‍රධාන තරගාකාරී පුවත්පත්වලට සාපේක්ෂව සමාගමේ පුවත්පත්වල අලෙවිය සැලකිය යුතු ලෙස අඩු වී තිබුණි.

### 5.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

සංයුක්ත සැලැස්මට අනුකූලව සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි. එසේ වුවත්, රජයේ සියලුම මුද්‍රණ සහ වෙළඳ දැන්වීම් කාර්යයන් ලබාගැනීම, ප්‍රධාන නිලතල සඳහා අනුක්‍රම සැලැස්මක් පිළියෙල කිරීම, ආදායම් ඉපයීම සඳහා නව ශාඛා විවෘත කිරීම, ප්‍රවාහන පිරිවැය අඩු කිරීම, නව ඉන්වෙන්ට්‍රි මොඩියුලයක් හඳුන්වා දීම සහ විකුණුම් හරවා එවුම් ඉවත් කිරීම යනාදී කටයුතු සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව එම කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

### 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී සමාගම විසින් ප්‍රසම්පාදන සැලැස්මක් නොමැතිව රු. මිලියන 40 ක ප්‍රාග්ධන වියදම් දරා තිබුණි.

### 5.4 අයවැය ලේඛනමය පාලනය

වියදම් පිළිබඳ ඵලාදායි පාලනයක් කළ හැකිවන පරිදි සමාගමේ වියදම් වර්ගයන්ට අනුකූලව විස්තරාත්මක අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ උපකරණයක් ලෙස භාවිත කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2014 මැයි 31 දින දක්වාම පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 5.6 නොවිසඳුනු විගණන ඡේද

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේදී නිකුත් කරන ලද විගණන වාර්ථාව මගින් පෙන්වා දෙන ලද පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි.

(i) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව කුලී පදනම මත වාහන ලබා ගැනීම.

(ii) ටෙන්ඩර් කැඳවීමකින් තොරව හා ගිවිසුම්වලට එළඹීමකින් තොරව වාහන අත්පත් කරගැනීම.

(iii) සීමාසහිත ලේක්හවුස් ප්‍රොපට් ඩිවොලොප්මන්ට් සමාගමේ සහ සීමාසහිත ඉන්ෆෝ මීඩියා (පෞද්ගලික) සමාගමේ ආයෝජනය කර තිබුණු පිළිවෙලින් රු. 7,500,000 ක් හා රු 2,500,000 ක් සඳහා කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබීම.

(ආ) 2013 දෙසැම්බර් 09 දින පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ලබාදුන් පහත සඳහන් නියෝග පිළිපැද නොතිබුණි.

(i) මුදල් අධ්‍යක්ෂවරයා ලෙස සුදුසු පුද්ගලයෙකු පත්කිරීම
(ii) විගණකාධිපතිවරයා වෙත වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කිරීම.
(iii) ලංකා පුවත් සමාගමේ අයෝජනය කර තිබුණු රු. මිලියන 1.2 ක මුදලට අදාළව විධිමත් ක්‍රියාමාර්ග ගැනීම

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පලන ක්ෂෙත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(i) ප්‍රසම්පාදන
(ii) බලතල බෙදාහැරීම
(iii) වාහන උපයෝජනය
(iv) ණයගැතියන්
(v) වත්කම් කළමනාකරණය
(vi) තොග
(vii) ස්ථාවර වත්කම්
(viii) වානිජ මුද්‍රණ කටයුතු
(ix) කාරක ප්‍රාග්ධන කළමනාකරණය
(x) ආයෝජන



**ඩබ්ලිව්. පී.සී. වික්‍රමරත්න**
විගණකාධිපති (වැඩබලන)

## 2.2 ගිණුම් සඳහා පිළිතුරු

### 2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

පිළිගතිමි.

### 2.2.2 සමාගමේ අඛණ්ඩ පැවැත්ම

කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරන ප්‍රමිතියේ ඡේද අංක 3.9 ට අනුව "යථා පැවැත්මක් ඇති ආයතනයක් අඛණ්ඩ පැවැත්මේ පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල නොකරන විට එයට හේතු සාධක එය පිළියෙල කිරීමට අනුගමනය කරන පදනම සමගින් හෙළිදරව් කළ යුතුයි" කළමනාකාරිත්වය පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හැකියාව පිළිබඳ තක්සේරුවක් කර ඇත. මෙය ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 3.3 යටතේ විස්තර කර ඇත. ශුද්ධ වත්කම් වල අඩුවීම 2009.01.01 - 2013.12.31 දක්වා 32% මිස 39% නොවේ. එහි වටිනාකම රු. මිලියන 184 කි. එයට ප්‍රධාන හේතුව වන්නේ 2009 සහ 2010 ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමයේ සම්පූර්ණ වියදම වූ රු. මිලියන 175 පොත් වලින් ලියා හැරීමයි. ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ දිගු කාලයක් මුළුල්ලේ ක්‍රමයෙන් අඩුකරමින් ගියානම් මෙම ශුද්ධ වත්කම් වල අඩුවීම ඉතා කුඩා ප්‍රමාණයක් වීමට ඉඩ තිබුණි.

ඉන්ෆෝ මීඩියා පෞද්ගලික සමාගමේ ඔවුන්ගේ සමස්ථ මෙහෙයුමේදී ලැබූ අලාභය රු. මිලියන 6.9 පමණි. සමාගම් සමූහයේ ඒකාබද්ධ ශේෂයන් හා සසඳන විට මෙම ප්‍රතිඵලය ඉතා අවම මට්ටමක පවතී.

### 2.2.3 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

අ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහාවූ (SLFRS/SME) හි ඡේද 23.10(අ) යටතේ විකිණීමක් වශයෙන් හඳුන්වන්නේ යම් භාණ්ඩයක හිමිකාරිත්වය එහි අවදානමක් සමග මිලදී ගන්නාට මාරුකරන අවස්ථාවය. පුරුද්දක් වශයෙන් අපි වාර ප්‍රකාශන පොත් වෙළඳුන්ට නිකුත් කරන්නේ විකිණීමට හෝ ආපසු එවීමේ පදනම මතය, විකිණීමක් වශයෙන් හඳුන්වන්නේ පොත් සාප්පු විසින් භාණ්ඩ අලෙවි කළ විට පමණි.

(ආ) මෙම ගණුදෙනු වාර්තා කිරීමේදි වරදක් සිදු වී ඇත. මෙය 2014 ගිණුම් වලින් නිවැරදි කරනු ලැබේ.

(ඇ) ආරම්භයේ පටන් මෙම වත්කම මෙහෙයුම් කල් බද්දක් ලෙස සටහන් කර ඇත. මෙම කල්බද්ද සම්බන්ධව එකම ගෙවීම වූ රු. 8,966/- වාර්ෂික ගෙවීම කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටය. එම නිසා අපි මෙම වත්කම ශූන්‍ය භාණ්ඩ වලට ගන්නේ නම් ඉන් මූල්‍ය තත්ත්වයට වන වෙනස ඉතා අවමය.

(ඈ) ණයගැති වෙන්කිරීම් සඳහා අනුගමනය කරන ගිණුම් ප්‍රතිපත්ති වාර්ෂික වාර්තාවේ ගිණුම් ප්‍රතිපත්ති ඡේද 3.11.1 මගින් අනාවරණය කර ඇත.

(ඉ) පිළිගතිමි.

### 2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

අ) පුවත්පත් කර්මාන්තයේ ආපසු එවුම් අඩුකරනු ලබන්නේ පුවත්පත් නියෝජිතයින්ගේ මාසය අගදී පිළියෙල කරන බිල්පතෙනි. ගිණුම් ප්‍රතිපත්තිය මගින් අනාවරණය වන පරිදි මාසය තුළ සියලුම බෙදාහැරීම් සහ මාසය තුළ සියලුම ආපසු එවීම් වාර්තා වී ඇත්තේ මෙම මාසික බිලෙහිය. එම නිසා මාසික ඉන්වොයිස් පතේ සඳහන් වන ආපසු එවුම් පසුගිය කාල පරිච්ඡේදයන්වල ඒවාය. එම නිසා නිතරම ආපසු එවුම්වල කාල පරාසයක් ඇත. මෙම ඉන්වොයිස් පත්වල විස්තර අදාළ පුවත්පත් නියෝජිතයින්ගේ ආදායම් සහ ණයගැති සත්‍ය ගිණුම් ශේෂයන් හා වාර්තා කර ඇත. ඔබ විසින් සඳහන් කරන පරිදි අප ආපසු එවුම් වෙනස් කිරීමට ගියහොත් සත්‍ය බිල්පත් (ප්‍රකාශන) අදාළ කාල පරිච්ඡේදය තුළ සිදුවූ සත්‍ය ගනුදෙනු සමග සම නොවනු ඇත.

ආ) සමාගමට වාණිජ හා මෙහෙයුම් අවශ්‍යතාවයන්ට අනුව කලින් කලට වෙනස්වන ව්‍යුහාත්මක සහ පරිබාහිර පරිපාලන දෙපාර්තමේන්තු කිහිපයක්ම ඇත. සමාගම වඩු කාර්මික අංශය ආරම්භ කළ දින සිට බොහෝමයක්ම අළුත්වැඩියා කිරීම් අභ්‍යන්තරවම සිදුකෙරිණි. මෙම වෙනස්වීම් නිරන්තරයෙන් සිදු වේ. එම නිසා ප්‍රාග්ධනගත කිරීම වෙනුවට අදාළ වියදම් ප්‍රධාන වශයෙන් දැව, තුනී ලෑලි සහ අනෙකුත් විවිධ අමුද්‍රව්‍යයන් මිලදී ගැනීම සඳහා වියදම් වී ඇත.

ඇ) පිළිගනිමි. ගබඩා කිරීමේ ක්‍රියාපිළිවෙතක් අනාගතයේ ක්‍රියාත්මක කිරීමට සටහන් කර ගනිමි.

ඈ) එකඟවෙමි. මෙම අධි වෙන් කිරීම 2014 වසරේදී නිවැරදි කරමි.

### 2.2.5 පැහැදිලි නොකරන ලද වෙනස්කම්

අ) ඉන්ධන තොග සැසඳීමේදී ලැබූ භාණ්ඩ තොගයකට කරනලද පෙර ගෙවීමක් සැළකිල්ලට ගෙන නොතිබුණි. පසුව මෙය හඳුනාගැනීමෙන් පසු 2014 ගිණුම්වලට ඇතුළත් කරන ලදී.

පවසන ලද ගිණුම් 8 සැසඳීමට ලක්කර ඇත. එකතුවේ වෙනස වූ රු. 3,967,520 සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ ගොස් මැග්නම් මුද්‍රණ යන්ත්‍රයේ අමතර කොටස් මිලදී ගැනීමය. මෙම අයිතමයන් ලැබුනවිට නිකුත් කිරීමේ පදනම මත ලැබී ඇත. මෙය රු. 4,943,026 වටිනාකමට ගබඩා දෙපාර්තමේන්තුව මගින් තොග අයිතමයක් ලෙස ගණනය කර ඇත. මෙය 2013 භෞතික තොගයට ගෙන නැත. එබැවින් 2014 දී නිවැරදි කරනු ලැබේ.

ආ) 2013 දෙසැම්බර් 31 දිනට ලෙජරයේ සම්පූර්ණ ණය ගැති ශේෂය රු. මිලියන 878 වයස් අනුව විශ්ලේෂණය කරන ලද පරිගණක පද්ධති ශේෂයන් සමග රු. 680,720 ක වෙනසක් නිසා නොසැසඳුනි. කෙසේ වෙතත් මෙය පසුව නිවැරදි කරන ලදී.

ඇ) විගණන දෙපාර්තමේන්තුව මගින් මෙම වෙනස්වීම් වල නිවැරදි විස්තර අපට දන්වා නැත. කෙසේ වෙතත් සමාගම විසින් පවත්වාගෙන යන සේවකයින්ගේ ලැබීම් සහ අර්ථසාධක අරමුදල මගින් පවත්වාගෙන යන සේවකයින්ට ගෙවිය යුතු මුදල එකිනෙකට නොසැසඳේ යන්න පැහැදිලි හේතුවකි. සමාගමට ලැබිය යුතු මුදල යනු නොපියවූ ණයයි. අර්ථසාධක අරමුදල ගෙවිය යුතු මුදල යනු සේවකයින්ගේ සහභාග ශේෂයන්ය. එබැවින් මෙම වටිනාකම් දෙක ගැළපිය නොහැක.

### 2.2.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

අ) ලේක්හවුස් ආයතනය අගරු චෙක්පත් නිසා නිරන්තරයෙන්ම නොපියවූ ණය ශේෂයන් අයකරගැනීමට උචිත ක්‍රමවේදයක් අනුගමනය කරයි.

2013.12.31 දිනට අගරු චෙක්පත් පිළිබඳ ප්‍රකාශයක් පහත චක්‍රයෙන් පෙන්වා ඇත.

| වසර | චෙක්පත් ප්‍රමාණය | මුදල රු. | මුදල රු. |
|---|---|---|---|
| 2009 | 08 | 215,701.00 | |
| 2010 | 29 | 946,058.52 | |
| 2011 | 15 | 797,995.60 | 1,959,755.12* |
| 2012 | 14 | 483,177.00 | |
| 2013 | 49 | 2.346,868.78 | 2,830,045.78 |
| **එකතුව** | **115** | **-** | **4,789,800.90** |

* 2013 වසර දක්වා චෙක්පත් 115 අගරුවූ අතර ඉන් චෙක්පත් 52 ක් වසරකට අධික කාලයක් තිස්සේ නොපියවී පවතී.

ආ) ලේක්හවුස් ආයතනය විගණකාධිපති දෙපාර්තමේන්තුව හා එකඟ වූ පරිදි රු. 200,000 වැඩි ණය ගැතියන්ට ශේෂය තහවුරු කිරීමේ ලිපි යවන ලදී. කෙසේ වෙතත් ණය ගැතියන් කිහිපදෙනෙක් පමණක් ප්‍රතිචාර දැක්වූ අතර මෙම තත්වය අපට පාලනය කළ නොහැක.

ඇ) 2013 දෙසැම්බර් 31 දිනට රු. 65,464,439 වසරකට වැඩි ණයගැති ශේෂයන් තිබුණද 2014 වසරේදී මෙයින් බහුතරයක් පියවාගැනීමට අපට හැකිවිය. ණය පාලන ක්‍රියාවලිය සුමට කිරීම සඳහා දිගුකාලීන නොපියවූ ණය නීති අංශයට යොමු කර ඇත.

(ඈ) තැන්පත් කරුවන් කිසිම තොරතුරක් ලබානොදීම නිසා සෘජු ණය සම්බන්ධ විස්තර අප සතුව නැත. මේ සම්බන්ධව තොරතුරු ලබාගැනීම සඳහා යම් විකල්ප ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත. බොහොමයක් සෘජු ලැබීම් හඳුනාගෙන නිවැරදි කර ඇත.

### 2.2.7 විගණනය සඳහා සාක්ෂි නොවීම

අ) විගණකයින් ඔවුන් විසින්ම නිරන්තරයෙන් පරීක්ෂාවට ලක්කරන ස්ථාවර වත්කම් රෙජිස්ටරයක සියලුම ස්ථාවර වත්කම් ඇතුළත් කරනු ලැබේ. වත්කම් වාර්ෂිකව ගණනය කරන අතර සන්තෙක්ෂණ වාර්තා අප සතුව ඇත.

### 2.2.8 නීතිරීති වලට අනුකූල නොවීම

අ) පිළිගතිමි.

ආ) ලේක්හවුස් ආයතනය කලට වේලාවට දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට නියමිත බදු ගෙවමින් දේශීය ආදායම් පනතට අවනත වේ. කෙසේ වෙතත් ප්‍රසාද දීමනා ගෙවීමේදී පැනනගින උපයන විට බදු සේවකයන් වෙනුවෙන් සමාගම විසින්ම ගෙවීමට සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය තීරණයන් ගෙන ඇත.

ඇ) 1. සටහන් කර ගතිමි
2. සටහන් කර ගතිමි
3. සටහන් කර ගතිමි.

ඈ) රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛන අංක 58 (2) ට අනුව ලේක්හවුස් ආයතනය 'එෆ්' වර්ගය යටතේ ලැයිස්තු ගත කර ඇත. චක්‍රලේඛයේ ඡේද 2.5 සම්පූර්ණ ඡේදය සැකවින් පහතින් දැක්වේ.

සමාගම් පනත ඊට අදාළ සාංගමික ව්‍යවස්ථාවලිය සහ බදු සහ අනෙකුත් නියාමන ප්‍රතිපාදන ඇතුලත් අනෙකුත් අදාළ නීති ප්‍රතිපාදන ඇති සංස්ථාපන පනතක් මගින් පාලනය වන එෆ් අනු වර්ගයේ රාජ්‍ය සතු ව්‍යාපාර සඳහා රජය මෙම චක්‍ර ලේඛනය අදාළ නොවේ. සභාපතිට අධ්‍යක්ෂක මණ්ඩලයට ආදීන්ට දීමනා ගෙවීම් එමෙන්ම මෙම උප වර්ගයේ රජය සතු ව්‍යාපාරික ස්ථානවල ප්‍රධාන විධායක නිලධාරීන්ගේ වේතන සහ අනෙකුත් දීමනා සහ කොන්දේසි සමාන ආයතන විසින් ගෙවනු ලබන තරගකාරී මිල ගණන් සැලකිල්ලට ගනිමින් අදාළ පුද්ගලයන්ගේ අධ්‍යාපන හා හැකියා මට්ටම සැලකිල්ලට ගනිමින් ගරු මුදල් හා ක්‍රම සම්පාදන ඇමති තුමාගේ එකඟතාවය මත අදාළ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයට තීරණය කළ හැක.

වැඩිදුරටත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ (www.treasury.gov.lk/2013-10-03-08- 47-42.html) ප්‍රදර්ශිත පොදු ව්‍යවසාය ලැයිස්තුවේ ලේක්හවුස් ආයතනය ඇතුලත්ව නැත.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සටහන් කර ගතිමි.

### 3.2 විශ්ලේෂනාත්මක මූල්‍ය සමාලෝචනය

සටහන් කර ගතිමි.

### 3.3 සමාගමට විරුද්ධව පවරා ඇති නඩු

නඩු සඳහා ඉල්ලුම් කරන ලද තොරතුරු යථා පරිදි ඔබ වෙත ඉදිරිපත් කරනු ලැබේ. ගිණුම් සටහන් අංක 5 සඳහන් පරිදි අසම්භාව්‍ය වගකීම් සඳහා වෙන් කිරීම රු. මිලියන 10 කි. විගණකයින් සඳහන් කරන පරිදි රු. මිලියන 1.6 නොවේ. කෙසේ වෙතත් 2014 දී මෙම වෙන්කිරීම රු මිලියන 20 දක්වා වැඩිකර ඇත.

### 3.4 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

කාරක ප්‍රාග්ධන තත්වයේ සංශෝධනයෙන් පසු කළමනාකාරිත්වය උගසට යටත් කරන ලද ණය සඳහා වූ කල් ඉකුත් වූ පොලිය වලක්වා ඵලදායි කාරක ප්‍රාග්ධනයක් පවත්වාගෙන යාමට කාල ණය පහසුකම්. මුළු බැංකු අයිරා පොලිය මෙම වර්ෂය සඳහා රු. මිලියන 28.2 කි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

අ) අලෙවි ක්‍රමෝපායක් වශයෙන් හිනවී යන මුද්‍රිත මාධ්‍යයේ කියවීම් හැකියාව නගාසිටුවීම පිණිස 2010 සිට 2013 දක්වා නව ප්‍රකාශන 15 හඳුන්වාදෙන ලදි. 2013 වසරේදී මෙම ප්‍රකාශන 15 න් ඉපයු සහභාගය රු. මිලියන 7.7 කි. විස්තර පහත පරිදි වේ.

**අලුත් ප්‍රකාශනවල මූල්‍ය ක්‍රියාකාරීත්වය - 2013**

රු’ 000 වලින්

| සංඛ්‍යාව | ප්‍රකාශන | වාර්තාකල මුළු ආදායම | සෘජු වියදම් | ගිණුම්වලට දයකත්වය |
|---|---|---|---|---|
| 1 | මාංචු | 51,558 | 24,628 | 26,930 |
| 2 | ආරෝග්‍යා | 13,269 | 12,966 | 303 |
| 3 | විදුණැන | 15,907 | 15,485 | 422 |
| 4 | සිත්මිණ | 12,739 | 16,143 | (3404) |
| 5 | අතුරු මිතුරු | 12,207 | 12,950 | (743) |
| 6 | වන්නාවානවිල් | 2,809 | 5,796 | (2987) |
| 7 | ආලෝක උදපාදි | 3,075 | 4,360 | (1285) |
| 8 | මුතු අහුර - 3 | 2,629 | 3,095 | (466) |
| 9 | මුතු අහුර - 2 | 2,575 | 3,105 | (530) |
| 10 | මුතු අහුර - 1 | 4,028 | 4,946 | (918) |
| 11 | මුතු අහුර - 4 | 2,123 | 2,829 | (706) |
| 12 | නමස්කාර | 3,677 | 6,656 | (2,979) |
| 13 | මිහිතුරු | 2,761 | 4,237 | (1,476) |
| 14 | දැනමුතු | 1,433 | 4,666 | (3,233) |
| 15 | බුදුසුවඳ | 4,359 | 5,581 | (1,222) |
| **එකතුව** | | **135,149** | **127,443** | **7,706** |

I ප්‍රකාශන 28 පරිපාලිත සමාගම් 3, වාණිජ මුද්‍රණ වාර්ෂික ප්‍රකාශන සහ ඩිජිටල් මුද්‍රණ ඇති සමූහ ව්‍යාපාරයක් විශේෂයෙන්ම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි විගණන අදහස් ප්‍රකාශ කිරීමේදී හඳුනාගත් ප්‍රකාශන 6 ගැන අදහස් දැක්වීම පිළිබඳ අපි එකඟ නොවෙමු. පසුගිය වසර පුරා රු. මිලියන 124 වන වාණිජ මුද්‍රණ වල පහත වැටීමක් නිසා සමාගම් සමූහයේ පිරිවැටුම රු. මිලියන 107 කින් පහත වැටී ඇත. එබැවින් වාණිජ්‍ය මුද්‍රණ හැර සමූහ ව්‍යාපාරයේ පිරිවැටුම වැඩිවී ඇති බව සනාථ වේ.

II ප්‍රකාශන 28 මුළු විකුණුම් ආදායම රු. මිලියන 17 කින් ඉහළ ගොස් තිබියදී එනම් 2012 රු. මිලියන 674 සිට 2013 දී රු. මිලියන 691 දක්වා පුවත්පත් 6 ක විකුණුම් ආදායම අඩුවී ඇති බවට පළකරන මතයට අපි සම්පූර්ණයෙන්ම එකඟ නොවෙමු. ඔබ සඳහන් කරන පහත වැටීම ආතිතික වුවත් එය ඉතා අහිතකර අන්දමින් අපට බලපෑ හැක. මන්ද අපි කටයුතු කරන්නේ බෙහෙවින්ම තරගකාරී වෙළඳ පළකය. අපගේ ප්‍රතිවාදීන් මෙය උපයෝගි කරගනිමින් අපගේ පාරිභෝගිකයින්ව ඔවුන්ගේ පුවත්පත් සඳහා අද්දවාගත හැක.

## 4.2 කළමනාකාරීත්වයේ අකාර්යක්ෂමතා

අ) 2014 ජුනි දක්වා අප පසුගිය වසරේ ණය ගැති ශේෂයන්ගෙන් රු. 4,048,940 (41%) එකතු කර ගතිමු. බිස්නස් ලංකා ඒවි (පුද්ගලික) සමාගම ණය අයකර ගැනීම් පිළිබඳ ඉතා සුපරික්ෂාකාරිය. බොහෝ අවස්ථා වලදී ණය පහසුකම් සැපයීම ණය අයකර ගැනීමේ කාල සීමාවන් ඉක්මවා යාම වැලැක්විය නොහැකියි. කෙසේ වෙතත් අය කර ගැනීම් ඉතාමත් යෝග්‍ය සහ ප්‍රායෝගික ලෙස මවු සමාගමට කිසිම හානියක් නොවන අයුරින් සිදු වේ. ණය එකතු කරගැනීම් වැඩිකර ගැනීමට සහ බොල් ණය අවම කර ගැනීමටත් ගත හැකි සියලුම ක්‍රියා මාර්ගයන් ගෙන ඇත.

ආ) ගතවු වසර තුළ 15% වු නියෝජිත කොමිස් වලට අමතරව ගතවු වසර තුළ හොඳම ආදායම් උපයන නියෝජිත ආයතන 10 ඔවුන් ආයතනයට ලබාදෙන දායකත්වය හා හැකියාවන් පදනම් කරගෙන දිරිගැන්වීම් දීමනා යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදි. ප්‍රතිවාදීන් ඔවුන්ගේ ව්‍යාපාරයේ බැඳ තබා ගැනීමට දෙන ඇදහිය නොහැකි තරමේ වට්ටම් සහ අනෙකුත් සහන පරයා යාමට ලේක්හවුස් හා ව්‍යාපාරික වාසිය සහ ආදායම උපරිම කිරීමේ කැපවීම සුරක්ෂිත කිරීමටත් පදනම් කරගෙන නියෝජිත කොමිස් සහ දිරිගැන්වීමේ දීමනා යෝජනා ක්‍රමයක් පිරිනමන ලදී. ලේක්හවුස් ආයතනය එකතු කිරීම් පිළිබඳ ඉතා සුපරික්ෂාකාරීවන අතර අවදානම් එළිදරව් කිරීම පිළිබඳ තීක්ෂණ බුද්ධිය බොහෝ ප්‍රායෝගික අයුරින් කටයුතු සුමට කරමින් ව්‍යාපාරය ආරක්ෂා කරමින් තරග කරුවන්ට මුහුණ දේ. බොහෝ අවස්ථාවන් වලදී ණය පහසුකම් සැපයීම ණය දෙන කාල සීමාව අහිබවා යාම නොවැලැක්විය හැකියි.

ඇ) පුරුද්දක් වශයෙන් සමාගම සති 7 ක පුවත්පත් අලෙවි වටිනාකම මූලික තැන්පතුවක් ලෙස තබා ගනී. කෙසේ වෙතත් වෙළඳපලේ ඇති ලේක්හවුස් ආයතනයේ ප්‍රකාශනවල වර්තමාන තත්වය අනුව නව පත්වීම් සෑම එකකටම මෙය භාවිතා කළ නොහැකිය. වර්තමානයේ සමාගම නව පත්වීම් වල ස්වභාවය අනුව තැන්පත් කොටස් ගෙවීම් වශයෙන් එකතු කර ගැනීමට පියවර ගෙන ඇත.

සතිපතා සැපයීමේ වටිනාකම, සැපයුම් වැඩිවීම, ප්‍රකාශන වාර ගණන සහ ප්‍රකාශන වල මිල ආදිය නිසා වෙනස් වේ. මේ නිසා කිසිම පුවත්පත් ප්‍රකාශකයෙකුට අවශ්‍ය කරන තැන්පතුවක් ස්ථිර තැන්පතුවක් වශයෙන් තබා ගැනීමට හැකියාවක් නැත.

සමාගම සත්‍ය සහ අවශ්‍ය කරන තැන්පතු මට්ටම්වල පරතරය අවම කිරීමට මාසික තැන්පත් වාරිකයක් ස්ථාපිත කිරීම මගින් හැකි උපරිම මට්ටමින් කටයුතු කර ඇත. සාමාන්‍ය වාරිකය මසකට රු. 400,000/- (දල වශයෙන්) කි. කෙසේ වෙතත් ඇතැම් පුවත්පත් අලෙවි නියෝජිතයින්ගේ ගිණුම්වල ඇති අතිරේක තැන්පතු ද හඳුනාගැනීමට හැකිවිය.

ඈ) පුවත්පත් ප්‍රකාශකයින් අතර දැඩි තරගයක් උද්ගතව ඇත. සෑම කෙනාම පාහේ අනෙකා පරයා යෑමට උත්සාහ කරයි. එම නිසා ව්‍යාපාරික අවස්ථාවන් ආකර්ෂණය කර ගැනීමට සහ පාරිභෝගිකයින් රඳවා ගැනීමට සමාගම් වලට කොමිස් ගෙවීමට සිදුවේ. බොහෝ රජයේ විද්‍යුත් දැන්වීම් ජනමාධ්‍ය තොරතුරු අමාත්‍යාංශය යටතේ සැලසිනේ දැන්වීම් ආයතනය මගින් ලබාගැනීමට සිදුව ඇත.

ඉ) ප්‍රසාදාත්මක දිනපොත් වියදම්, වැරදිමකින් වාර්ෂික ප්‍රකාශන අලෙවි පිරිවැයක් ලෙස සලකා ගිණුම්ගත නොකර දෙපාර්තමේන්තුවට අඛණ්ඩව පිටපත් කර ඇත. මෙම වෙනස නිවැරදි කිරීමෙන් පසු දෙපාර්තමේන්තුව ලාභදායක වේ. අනාගතයේදී මෙය නිවැරදි කරනු ලැබේ.

ඊ) අත්හදා බැලීමක් ලෙස හඳුන්වා දුන් සංශෝධිත ආපසු එවුම් ක්‍රමය පැරණි ක්‍රමය නැවත ඇති කිරීමෙන් මෑතකදී ඉවත් කරන ලදි.

උ) පිටකිරීම් හා ආපසු එවුම් ප්‍රමාණයන් වාර්තා කිරීම මගින් අප නව ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත.

# විගණන නිරීක්ෂණයන්ට සභාපතිතුමාගේ පිළිතුරු

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

අ) පිළිගනිමි.

ආ) මෙම මතයට අපි එකඟ නොවෙමු. ඩිජිටල් මුද්‍රණ අංශය රු. මිලියන 1.5 ලාභදායි සහභාගයක් වසර තුළදී උපයා ඇත. වේතන පිරිවැය ආපසු අයකර ගත නොහැකි ස්ථාවර පිරිවැයක් ලෙස සලකන අතර එය මෙහිදී අදාළ නොවේ.

## 4.4 අඛණ්ඩ ස්වභාවයේ ගණුදෙනු

බාහිර විගණක ගේ නිර්දේශයේ අවශ්‍යතාවය ඉටුකරනු පිණිසත් අඛණ්ඩව ක්‍රමෝපායික අවශ්‍යතාවය දැණුන නිසාත් 2012 දී සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ තුමාගේ පූර්ණ අනුමැතියෙන් දැන්වීම් ප්‍රවර්ධන යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය දැනටමත් වසර 2013 සහ 2014 සඳහා ලැබී ඇත.

විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන් අතර ඇති තියුණු තරගකාරිත්වය නිසා ආදායම උපරිම තත්වයෙන් ලබාගැනීමට නොයෙකුත් ප්‍රවර්ධන පැකේජයන් හඳුන්වා දී ඇත. එසේ වුවත් 2011 දී අප ඉපයූ ආදායම කරා ළඟාවීමට අපට නොහැකි විය. තද බල තරගයක් මධ්‍යයේ උවද අප තවමත් වෙළඳපල අපට හිමි කොටස රැකගෙන සිටිමු.

අපගේ වෙළඳපොල කොටස පවත්වාගෙන යාමට අප දිරි දීමනා ගෙවීම් යෝජනා ක්‍රමය ඉදිරි කාල සීමාවන් වලටත් අඛණ්ඩව පවත්වාගත යුතුය. එම නිසා දිරි දීමනා ගෙවීම් යෝජනා ක්‍රමය අපගේ ව්‍යාපාරික මෙහෙයුම් වලට හඳුන්වාදීම අත්‍යවශ්‍යය.

## 4.5 අ) අක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්

තහඩු සෑදීමේ ක්‍රියාවලියේ තාක්ෂණයේ වෙනස් වීම නිසා තහඩු සෑදීමේ යන්ත්‍ර කිහිපයක්ම ඉවත් කිරීමට සිදු විය. එසේම මෙම පූර්ණ වශයෙන්ම ක්ෂය කරන ලද බෙහෙවින්ම පැරණි යන්ත්‍ර අනාගතයේදී ඉවත්කිරීමට සිදුවේ.

ආ) මෙම බෙහෙවින්ම පැරණි ක්ෂය කරන ලද මුද්‍රණ යන්ත්‍ර කඩිනම් ඉවත්කිරීම් සඳහා සූදානම්ව ඇත.

ඇ) පිළිගනිමි. දේපල සංවර්ධනය සඳහා අප දැනටමත් යෝජනා ලබාගෙන ඇත.

## 4.6 ආර්ථික නොවන ගනුදෙනු

අ) පිළිගනිමි.

ආ) නියමු ව්‍යාපෘතියක් වශයෙන් අධ්‍යාපනික පොත් වර්ග 7 ක් මුද්‍රණය කර ප්‍රථම තොගය සරසවි පොත්හලට යවන ලදි. සරසවි පොත්හල එම විකුණුම්වල කාර්ය ඵලය අපට දැන්වූ විට ඒ අනුව ඉතිරි පොත් තොගය අනෙකුත් පොත් සාප්පු වෙත නිකුත් කිරීමට අප සැලසුම් කරමු.

ඇ) කලින් අප සතුව අඩි 20 දිග වරකට මෙට්‍රික් ටොන් 16 ප්‍රවාහණය කළ හැකි ප්‍රයිම් මුවර් රථයක් තිබුණි. මෙම රථයේ ධාරිතාව මද නිසා වරකට ටොන් 23 පමණ ප්‍රවාහනය කළ හැකි නව ප්‍රයිම් මුවර් රථයක් මිලදී ගන්නා ලදී. මෙම නව රථය සාර්ථක ලෙස මෙහෙයුම් ක්‍රියාවලිය සඳහා ප්‍රයෝජනයට ගෙන ඇත.

ඈ) i) මෙම ආයෝජන වල පිරිවැය වසර ගණනකට පෙර රු. මිලියන 1 වු අතර 2013.12.31 දිනට ශේෂපත්‍රයේ වෙළඳපල වටිනාකම රු. මිලියන 134.4 විය. ප්‍රතිලාභයේ වැඩිවීම මෙමගින් මනාව පැහැදිලි වේ. එසේ උවත් නාමික අගයට ගෙවන ලාභාංශ වටිනාකම අඩුය.

ii) පිළිගනිමි.

### 4.7 හඳුනාගත් පාඩු

ආ) එක්සත් ජනතා නිදහස් සන්ධානය පෝස්ටර් මුද්‍රණය සඳහා රු. 43,447,015/- සමාගමට ගෙවීමට තිබේ. එකල අධ්‍යක්ෂක මණ්ඩලය මෙම මුදල අයකර ගැනීමට නීති ක්‍රියාමාර්ගයන්ට මුල පුරණ ලදී. කෙසේ වෙතත් අධ්‍යක්ෂක මණ්ඩලයේ වෙනස්වීමත් සමගම පත්වූ නව අධ්‍යක්ෂක මණ්ඩලය මෙම නඩුව අස්කර ගැනීමට තීරණය කර ඇත. බදු නීතියට අනුව බදු සහන සලසා ගත හැක්කේ ණය අයකර ගැනීමට නඩුවක් පවරා ඇත්නම් හෝ එවැනි ණයක් ඇති බව උසාවිය තීරණය කළහොත් පමණි. උසාවියේ ගොනුකර ඇති නඩුවක් ඔවුන් විසින්ම ඉවත්කර ගත්විට සමාගමට බදු සහන සඳහා හිමිකම් කිව නොහැක. කෙසේ වෙතත් පෝස්ටර් මුද්‍රණය සඳහා අවශ්‍ය වූ මුද්‍රණ කඩදාසි තීන්ත වැනි අමුද්‍රව්‍යයන් මත යෙදවුම් එකතු කළ වටිනාකම් බද්ද (VAT Inputs) ට හිමිකම් කිව හැක.

ආ) පිළිගනිමි.

### 4.8 සමාගමේ මානව හා භෞතික සම්පත් අනෙකුත් ආයතන වලට මුදාහැරීම.

අ) පිළිගනිමි.

ආ) ජනාධිපති ලේකම් කාර්යාලයේ උපදෙස් අනුව නිලධාරීන් තිදෙනෙකු ජනාධිපති ලේකම් කාර්යාලයට සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයට මුදාහැර ඇත.

### 4.9 සේවක මණ්ඩල කළමනාකරණය

අ) 2010.08.31 ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමයෙන් පසු විශ්‍රාම ගැනීමෙන්, ඉල්ලා අස්වීමෙන් කොන්ත්‍රාත් නිමවීමෙන් විවිධ දෙපාර්තමේන්තුවල ඇතිවූ පුරප්පාඩු පිරවීමට ස්ථිර සේවකයින් 51 හා නව කොන්ත්‍රාත් පදනමින් සේවකයින් 56 ඇතුළුව සේවකයින් 107 පත්කොට ඇත.

ආ) පිළිගනිමි. අධ්‍යක්ෂවරුන්ගේ වේතන තීරණය කරනු ලබන්නේ වාර්ෂික මහ සභා රැස්වීමේදීය.

## 5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 5.1 සංයුක්ත සැලසුම

එකඟ නොවෙමි. බොහෝ ක්‍රමෝපායන් සඳහන් සංයුක්ත සැලසුම් ක්‍රියාවට නගා ඇත. විශේෂයෙන් විකුණුම් සම්බන්ධව වෙළඳපොල කොටස අත්පත්කරගැනීම සඳහා අප නිශ්චිත ක්‍රමෝපායන් ඉතා තදින්ම අනුගමනය කර ඇත. ඒ අනුව 2013 දී අප විකුණුම් වල වැඩිවීමක් වාර්තා කර ඇත.

### 5.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සුළු සුළු වෙනස්කම් ඇතත් සියලුම ක්‍රියාකාරකම් ප්‍රමුඛතා පදනම මත ක්‍රියාත්මක කරන ලදී.

### 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

එකඟ නොවෙමි. අප විශේෂයෙන්ම ප්‍රාග්ධන වියදම් සඳහා සැලසුම් කර ඇත. එම විස්තර අපගේ අයවැය වාර්තාවෙන් ඉදිරිපත් කර ඇත.

### 5.4 අයවැය පාලනය

එකඟ නොවෙමි. අපි අය වැය වාර්තා සහ සත්‍ය වාර්තා අවශ්‍ය අවස්ථාවන්හිදී ඉදිරිපත් කර ඇත.

### 5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

මේ වන විට මෙය මුද්‍රණය කරමින් පවතී. හැකි ඉක්මණින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබේ.

# විගණන නිරීක්ෂණයන්ට සභාපතිතුමාගේ පිළිතුරු

### 5.6 නොවිසඳුනු විගණන පරිච්ඡේදයන්

අ. i) අධ්‍යක්ෂක අනුමැතිය මත රථවාහන කුලියට ගන්නා ලදී.

ii) එකඟ නොවෙමි. ඔබගේ විමසීම් අංක 24 මගින් ස්ථිර කරන ලද 2013 හිමිකරගත් සියලුම රථවාහන ටෙන්ඩරයක් මගින්ම සිදුකරන ලදී.

iii) ලේක්හවුස් ප්‍රොපර්ටි ඩෙවලොප්මන්ට් (පෞද්ගලික) සමාගමෙන් ලාභාංශ නොලැබුණත් පරිපාලිත සමාගමට මෙම ඉඩමේ අයිතිය ඇති නිසා ශක්තිමත් ප්‍රාග්ධන අගය වැඩිවීමක් අත්වන නිසාත් කිහිප ගුණයකින්ම මෙහි වටිනාකම වැඩිවී ඇත.

ආ. i) සටහන් කර ගතිමි.

ii) වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම් ඇතුලත් අය වැය විගණනයට ඉදිරිපත් කර ඇත.

iii) ගෙවන ලද මුදල අයකර ගැනීමට අප පියවර ගනිමින් සිටිමු.

## 6. පද්ධති සහ පාලනය

ඔබ විසින් යොමු කරන ලද විෂය පථය දැනට සියුම්ව පරික්ෂණයට භාජනය කරමින් සිටිමි. අනාගතයේදී මෙම තත්වය ශක්තිමත් කිරීමට නිවැරදි ක්‍රියාමාර්ගයක් අනුගමනය කරමි.



**බන්දුල පද්මකුමාර**
**සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ**

# විස්තරාත්මක ආදායම්වල ඒකාබද්ධ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2013 රු '000 | 2012 රු '000 |
|---|---|---|---|
| ආදායම | 17 | 3,592,966 | 3,699,667 |
| විකුණුම් පිරිවැය | | (1,873,215) | (1,993,420) |
| දළ ලාභය | | 1,719,151 | 1,706,247 |
| වෙනත් ආදායම් | 18 | 137,699 | 105,694 |
| | | 1,857,450 | 1,811,941 |
| පරිපාලන වියදම් | | (1,319,986) | (1,289,000) |
| බෙදාහැරීමේ වියදම් | | (325,854) | (323,468) |
| මෙහෙයුම් ලාභය | 19 | 211,610 | 199,473 |
| මූල්‍ය වියදම් | | (138,537) | (142,044) |
| බදුවලට පෙර ලාභය හා සාධාරණ අගය ගැලපීම | | 73,074 | 57,429 |
| බදු වියදම | 20 | (12,094) | (5,781) |
| සාධාරණ අගය ගැලපීම | 07 | (2,035) | (59,928) |
| **වසරේ ලාභය** | | **58,945** | **(8,280)** |
| **ආරෝපිත ලාභය මුල් හිමිකරුවන්ට** | | **58,945** | **(8,280)** |

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2013<br>රු '000 | 2012<br>රු '000 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත හා උපකරණ | 06 | 326,537 | 372,570 |
| දිගුකාලීන මූල්‍ය වත්කම් | 07 | 135,362 | 137,397 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **461,899** | **509,967** |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 08 | 455,864 | 439,211 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 09 | 1,038,100 | 998,033 |
| ජංගම බදු වත්කම් | | 25,782 | 37,790 |
| මුදල් හා මුදලට සමාන වත්කම් | 10 | 56,967 | 37,646 |
| **මුළු ජංගම වත්කම්** | | **1,576,713** | **1,512,680** |
| **මුළු වත්කම්** | | **2,038,612** | **2,022,647** |
| **හිමිකම් හා වගකීම්** | | | |
| **හිමිකම්** | | | |
| අනුදත් ප්‍රාග්ධනය | 11 | 34,837 | 34,837 |
| රඳවාගත් ආදායම | | 346,905 | 287,960 |
| **මුළු සාමාන්‍ය කොටස්** | | **381,742** | **322,797** |
| **වගකීම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| තැන්පතු | 12 | 166,829 | 177,870 |
| ණය | 13 | 187,132 | 154,983 |
| සේවක ප්‍රතිලාභ බැඳියාව | 16 | 298,579 | 283,802 |
| ආයතනයට එරෙහි නඩු සඳහා වෙන්කිරීම් | 14 | 10,000 | 10,000 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **662,540** | **626,655** |
| **ජංගම වගකීම්** | | | |
